2014

# වැලිවේරිය රතුපස්වල ප්‍රදේශයේ ජල ගැටලුව සම්බන්ධයෙන් පැවති උද්ඝෝෂණය විසුරුවාහැරීමේදී ඇති වූ ගැටුම්කාරී සිද්ධියට අදාළ පරීක්ෂණ වාර්තාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

# වැලිවේරිය, රතුපස්වල ප්‍රදේශයේ ජල ගැටළුව සම්බන්ධයෙන් 2013.08.01 දින පැවති උද්ඝෝෂණය විසුරුවා හැරීමේදී ඇති වූ ගැටුම්කාරී සිද්ධියට අදාළ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණ වාර්තාව

රතුපස්වල වැලිවේරිය ප්‍රදේශයේ වෙනින්ග්‍රෝස් කර්මාන්ත ශාලාව නිසා එම ප්‍රදේශයේ පානීය ජලය අපවිත්‍ර වී ජලයේ පී.එච් අගය අඩු වී ඇති බවට ජනතා මතයක් ඇති වී එම කර්මාන්ත ශාලාව වසා දමන ලෙසට ප්‍රදේශවාසින් විසින් 2013.07.27 වන දින සිට 2013.08.01 දින දක්වා උද්ඝෝෂණ මාලාවක් පවත්වා ඇති අතර, එම උද්ඝෝෂණ විසුරුවා හැරීම සඳහා යුද හමුදාව විසින් පහරදිම් සහ වෙඩි තැබීම් සිදු කර ඇති බවත්, එම වෙඩි තැබීම් හේතු කොට ගෙන පුද්ගලයින් තිදෙනෙකු මියගොස් විශාල පිරිසකට තුවාල සිදුවී ඇති බවට විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් කරන ලද හෙළිදරව්වට අනුව මානව හිමිකම් කොමිෂන් සභාවේ ගරු සභාපති ප්‍රියන්ත පෙරේරා මහතා ඇතුලු කොමසාරිස් මණ්ඩලයේ උපදෙස් මත ඉහළ කළමණාකාරිත්වයේ මෙහෙයවීම යටතේ නීති නිලධාරීන් හා විමර්ශන නිලධාරීන්ගෙන් සැදුම්ලත් විශේෂ විමර්ශන කණ්ඩායමක් විසින් විමර්ශනයක් සිදුකරන ලදි.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙම සිදුවීම කරුණු 02 ක් යටතේ විමර්ශනය කරන ලදි. ඒ අනුව අධීක්ෂණ හා සමාලෝචන අංශය මගින් වෙනින්ග්‍රෝස් ආයතනයේ පරිසර හිතකාමී නොවන ක්‍රියාවන් හේතුකොට ගෙන රතුපස්වල, වැලිවේරිය හා ඒ අවට ප්‍රදේශවල භූගත ජලය අපවිත්‍ර වී එහි පී.එච්. අගය අඩුවී තිබුණේ නම් ඒ පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරිය, ප්‍රදේශිය සභාව ප්‍රාදේශිය ලේකම්, දිස්ත්‍රික් ලේකම් යනාදි රාජ්‍ය ආයතන වල වගකීම් පිළිබඳව සොයා බැලීම සහ අදාළ ආයතන විසින් තමන්ගේ වගකීම නිසි පරිදි ඉටු කර තිබේද යන්න පිළිබඳව එක් විමර්ශනයක්ද,

පරීක්ෂණ හා විමර්ශන අංශය මගින් 2013.08.01 දින වැලිවේරිය නගරයේ සහ බැලුම්මහර මංසන්ධියේ පැවති උද්ඝෝෂණය විසුරුවා හැරීමට යුද හමුදාව සහ පොලිසිය ක්‍රියා කළ ආකාරය අනුව මූලික අයිතිවාසිකම් කඩ කිරීම් සිදුකර තිබේද යන්න පිළිබඳව තවත් විමර්ශනයක් ද සිදුකරන ලදි.

ඒ අනුව විශේෂ විමර්ශන කණ්ඩායම විසින් 2013.08.02 දින ස්ථානිය පරීක්ෂාවක් සිදුකරමින් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගෙන් සහ කර්මාන්ත ශාලාව අවට ප්‍රදේශවාසීන්ගෙන් තොරතුරු විමසීම් කර වෙනින්ග්‍රෝස් (පුද්ගලික) සමාගම (D.P.L) ස්ථානය ද නිරීක්ෂණයට ලක් කරන ලදි.

ඉන් අනතුරුව 2013.08.05 වන දින රාජ්‍ය ආයතන 21 ක උසස් නිලධාරීන් කොමිෂන් සභාවට කැඳවා විශේෂ සාකච්ඡාවක් පැවැත්වූ අතර, සති 2 ක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත වාර්තාවක් ලබාදෙන ලෙස දැනුම්දෙන ලදි.

නැවතත් විශේෂ විමර්ශන කණ්ඩායම 2013.08.22 හා 2013.08.23 දින වැලිවේරිය ප්‍රදේශයට ගොස් වැලිවේරිය පොලිස් ස්ථානාධිපති, ගම්පහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සහ ගම්පහ මූලික රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා හමුවී සාකච්ඡා කළ අතර, මියගිය පුද්ගලයින්ගේ හා තුවාල ලැබූ පුද්ගලයින්ගේ නිවෙස් වලට ගොස් ප්‍රකාශ සටහන් කර ගන්නා ලදි.

2013.08.27 දින මාධ්‍යවේදීන් කැඳවා විශේෂ සාකච්ඡාවක් කොමිෂන් සභාවේදී පැවති අතර, එදින 2013.08.01 දින උද්ඝෝෂණය සම්බන්ධයෙන් මාධ්‍ය ආවරණය කිරීමට ගිය මාධ්‍යවේදීන්ට යුද හමුදාව විසින් සිදුකරන ලද පහරදීමට අදාළව කොමිෂන් සභාවේ පැමිණිල්ලක් ගොනු කරන බව මාධ්‍යවේදීන් විසින් ප්‍රකාශ කරන ලදි.

2013.08.23 දින වැලිවේරිය ප්‍රදේශයේ සිවිල් සංවිධාන කැඳවා විශේෂ සාකච්ඡාවක් පැවැත්වූ අතර, 2013.08.01 දින සිදුවූ සිදුවීමට අදාළව පහරකෑමට ලක්ව හෝ ඇසින් දුටු පුද්ගලයන් සිටිනම් කොමිෂන් සභාව වෙත පැමිණ හෝ ලිඛිතව පැමිණිලි ඉදිරිපත් කරන ලෙස දැනුවත් කරන ලදි.

2013.08.03 දින විශේෂ විමර්ශන කණ්ඩායම 2013.08.22 හා 2013.08.23 දින වැලිවේරිය ප්‍රදේශයට ගොස් කල්‍යාණි මාවත, පින්කෝවත්ත ප්‍රදේශවල සංචාරය කරමින් 2013.08.01 දින සිදුවූ සිදුවීමට අදාළව පහරකෑමට ලක්ව හෝ වෙඩි වැදීමට ලක්ව සිටින පුද්ගලයින්ගේ නිවෙස්වලට ගොස් ප්‍රකාශ සටහන් කරගන්නා ලදි.

2013.08.30 දින ජන මාධ්‍ය එකතුව වෙනුවෙන් ලසන්ත රුහුණගේ මාධ්‍යවේදියා විසින් තොරතුරු වාර්තා කිරීමට ජනමාධ්‍යවේදීන්ට ඇති අයිතිය තහවුරු කර දෙන ලෙසත් 2013.08.01 දින පැවැති උද්ඝෝෂණ මාධ්‍ය ආවරණය කිරීමට ගිය මධ්‍යවේදීන් 11 දෙනෙකුට සිදුවූ දුෂ්කරතා හා උපකරණවලට සිදුවූ හානිය ආදිය සැලකිල්ලට ගෙන අපක්ෂපාති පරීක්ෂණයක් පවත්වා නිර්දේශ ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

**සිවිල් වැසියන්ගේ ප්‍රකාශ :-**

කොමිෂන් සභාව විසින් විමර්ශන කටයුතු ආරම්භ කිරීමෙන් පසු සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රදේශයේ විවිධ වයස් සීමාවන් සහ විවිධ සමාජ තත්ත්වයන් දරණ සිවිල් වැසියන් 41 දෙනෙකුගේ ප්‍රකාශ සටහන් කර ගන්නා ලදි. කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් රතුපස්වල ප්‍රදේශයේ සංචාරය කරමින් සාක්ෂිකරුවන්ගේ නිවෙස් වෙත ගොස් ඔවුන් විසින් ලබාදෙන ලද ස්වාධීන ප්‍රකාශ සටහන් කර ගන්නා ලදි.

එම පුද්ලයන් අතර පහරදීම්වලට ලක්වූ පුද්ගලයන්, වෙඩි වැදී තුවාල ලබා සිටි පුද්ගලයන් මෙන්ම සිද්ධිය ඇසින් දුටු පුද්ගලයන්ද වේ. සමස්ථයක් වශයෙන් මොවුන්ගේ ප්‍රකාශ සලකා බැලීමේදී වැලිවේරිය සහ බැලුම්මහර උද්ඝෝෂණ විසිරුවා හැරීම සඳහා යුද්ධ හමුදාව විසින් පහරදීම් සහ වෙඩි තැබීම් සිදුකර ඇති බවට සාක්‍ෂි ලබාදී ඇත.

සිද්ධියෙන් පුද්ගලයන් තිදෙනෙකු මියගොස් විශාල පිරිසකට තුවාල සිදුවී ඇත. සිවිල් වැසියන් විසින් ලබාදෙන ලද ප්‍රකාශ හා පොලිස් හා හමුදා නිලධාරීන්ගේ ප්‍රකාශද ඊට අදාළ කරුණු දැක්වීම්ද මෙම විමර්ශනයේ නිරීක්‍ෂණ, නිගමන, නිර්දේශ ලබාදීමේදී අවධානයට ගෙන ඇත.

## මාධ්‍යවේදීන් විසින් ලබාදෙන ලද ප්‍රකාශ :-

විවිධ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය වල මාධ්‍යවේදීන් රතුපස්වල පළ ගැටළුව සම්බන්ධයෙන් පැවති උද්ඝෝෂණයේ මාධ්‍ය ආවරණය කිරීම සඳහා 2013.08.01 දින වැලිවේරිය ප්‍රදේශයට ගොස් ඇත. එම මාධ්‍යවේදීන්ට ද යුද්ධ හමුදාව විසින් පහරදී තුවාල සිදු කොට ඇති බවට හා ඔවුන්ගේ උපකරණ වලට හානි කර ඇති බවටද වාර්තා වී ඇත. බොහෝමයක් මාධ්‍යවේදීන් කොමිෂන් සභාව හමුවේ සාක්‍ෂි ලබාදීමට පවා බියක් දක්වා ඇති අතර, සිද්ධිය ඇසින් දුටු හා එම සිදුවීම්වලට මුහුණදුන් මුද්‍රිත මාධ්‍යවල මාධ්‍යවේදීන් පස් දෙනෙකු පමණ කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ ලබාදෙමින් ඔවුන් විසින් මුහුණ පාන ලද තත්ත්වය පැහැදිලි කරමින් ඉදිරියේ මෙවැනි සිද්ධීන් ඇතිවීම වැලැක්වීමට පියවර ගන්නා ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

මාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් “ජනමාධ්‍ය එකතුව” කොමිෂන් සභාව සහ අතෘප්තියට පත් මාධ්‍යවේදීන් සමඟ සම්බන්ධීකරණ කටයුතු කරමින් විමර්ශන කටයුතු සඳහා සහයෝගය ලබාදෙන ලදී.

## පශ්චාත් මරණ පරීක්‍ෂණ වාර්තා :-

උද්ඝෝෂණය විසුරුවා හැරීම සඳහා කරන ලද වෙඩි තැබීම හේතුවෙන් පුද්ගලයන් දෙදෙනෙකු සහ පහරදී බරපතල තුවාල සිදු කිරීම මත එක් පුද්ගලයකුද ඇතුළුව පුද්ලයන් තුන් දෙනෙකු මියගොස් ඇති අතර, ඔවුන් පිළිබඳව විස්තර පහත පරිදි වේ.

**<u>එච්.එස්.රවිශාන් පෙරේරා යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව හා ඊට අදාළ කරුණු :-</u>**

**මියගිය රවිශාන් පෙරේරාගේ මව වන එල්.මාගරට් යන අය මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පහත පරිදි ප්‍රකාශ කොට ඇත.**

තමා මිරිස්වත්ත සමුපකාර සමිතියේ රැකියාව කරන බවත් මෙම උද්ඝෝෂණයේදී මියගිය රවිශාන් පෙරේරා පුතු 2013 වර්ෂයේ උසස් පෙළ විභාගයට පෙනී සිටීමට සිටි අයෙකි. මෙම උද්ඝෝෂණයේදී මියගිය රවිපුතා 2013.08.01 දින සවස දුරකථනයෙන් කතා කොට වැලිවේරිය නගරයේ කළබලකාරී තත්ත්වයක් ඇති බව ප්‍රකාශකර සිටියා. පසුව මා සවස 6.00 පමණ පයින්ම ගෙදර පැමිණියා.

ඒ එන විට ලොකු පුතා නිවසේ සිටියේ නැත. රාත්‍රී 8.30 ට පමණ පුතාගේ ජංගම දුරකථනයට කතා කොට කළ විමසීමේදි ඔහු කියා සිටියේ තමා ඉන්නේ හෙලන්වත්ත පැත්තේ බවත් යුද හමුදාවෙන් වෙඩි තියන බවත් විනාඩි 10 කින් නිවසට එන බවත් ප්‍රකාශ කර ඇත. නමුත් පුතා නිවසට පැමිණියේ නැත. විදුලිය විසන්ධි වී තිබූ නිසා ඔහු සොයා යාමටද නොහැකි විය. පුතා නිවසට නොපැමිණීම නිසා උදේ ඔහු සෙවීමට යමින් සිටියදි දැන ගන්නට ලැබුනා ඔහුට වෙඩි වැදි රෝහල් ගත කර ඇති බව ගමනා ගමනය නවතා තිබූ බැවින් යාමට අපහසු තත්ත්වයක් තිබුනද රාජකාරී ස්ථානයෙන් ලබාදුන් වාහනයෙන් කොළඹ මහ රෝහලට පැමිණ දැඩි සත්කාර ඒකකයේ සිටි දරුවා හඳුනා ගත්තා දරුවා ඇස් ඇරලාවත් බැලුවේ නැත. මැෂින් හයි කර තිබුනා ඔලුව බැන්ඩේජ් කර තිබුනා. නැවතත් 2013.08.04 දිනද මා පුතා බැලීමට ගියා ඒ වන විටද පුතා සිටියේ ඒ ආකාරයෙන්මයි පසු දින දහවල් පොලිසිය විසින් දැනුම් දුන්නා පුතා මිය ගිය බව පුතා මියයාම හේතුවෙන් ජනාධිපතිතුමා විසින් ලක්ෂ 10 ක මුදලක් අපට ලබාදුන්නා.

පශ්චාත් මරණ පරීක්ෂණ වර්තාවේ සඳහන් තොරතුරු අනුව මොහුගේ වයස : අවු 19 කි. මරණය සිදුවී ඇත්තේ 2013.08.03 වන දින ප.ව 11.20 ට පමණ වේ. පශ්චාත්  මරණ පරීක්ෂණය 2013.08.04 වන දින අධිකරණ වෛද්‍ය නිලධාරි අපිත් තෙන්නකෝන් මහතා විසින් කොළඹ දී පවත්වා ඇත. මියගිය අයගේ සිරුරේ තුවාල හඳුනා ගැනීම සහ මරණයට හේතු වූ කරුණු දක්වා ඇත.

<u>Injuiries</u>

1. A tissue deficieny 15 x 4mm surrounded with an abrasion color over the left side of the forehead. It was 3cm above the lateral end of the left eyebrow. This was an entry wound of a firearm missile, which entered into the cranium in the left side of the frontal bone making multiple linear fractures extending to the back in temporal bone and to the right over the vertex. The missile has travelled to the left side of the head at the same level and making and exit in the left posterior temporal region.
2. An irregular shape laceration 5x3cm in maximum distances about 3cm above the ear level with everted edges. The brain matter was oozing through the wound under pressure. This was the external exit would of the missile.

   The distance between the entry and the exit was 8cm. The area 9x8cm of skull in between showed multiple fragmentation. There was a linear fracture extending from the posterior end towards the right parietal region over the vertex. The brain showed extensive laceration in the left temporal and parietal lobes. The brain was severely oedematous with secondary haemorrhages in the stem.
3. An abrasion 0.5cm in diameter on the left upper eyelid.

මරණයට හේතුව :- රයිෆල් ගණයේ ගිනි අවියකින් දුරසිට වෙඩි තැබීමක් මත මරණය සිදුව ඇත.

**<u>2. කේ.ඒ.ඩී අකිල දිනේෂ් අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව හා ඊට අදාළ කරුණු :-</u>**

මියගිය අකිල දිනේෂ්ගේ මව ප්‍රියංගිකා පයවර්ධන ශිරෝමනි යන අය මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පහත පරිදි ප්‍රකාශ කොට ඇත.

නො : 476/15, හෙලන්වත්ත, වැලිවේරිය යන ලිපිනයේ පදිංචි ඇය සේවය කරන මාසි එම්.ඒ.එස්.ආයතනය බියගම වෙත 2013.08.01 දින උදෑසන පිටත්ව ගිය බවත් තමා යන අවස්ථාවේදි වැලිවේරිය ප්‍රදේශයේදි කිසිදු කලබලකාරි තත්ත්වයක් නොතිබුනු බවත් කියා සිටි. පැමිණිලිකාරියගේ පුතා වන මෙම සිදුවීමෙන් මිය ගිය කේ.ඒ.ඩී.අකිල දිනේෂ් යන අය 2014 වර්ෂයේ උසස් පෙළ විභාගයට පෙනි සිටීමට සිටිය බැවින් ඔහු පැමිණිලිකාරියගේ මිතුරියකගේ නිවසට ගොස් පාඩම් කරන බවත් මෙදිනද එලෙස පාඩම් කිරීමට ගොස් ඇති බවත් කියා සිටි. පැමිණිලිකාරිය රාජකාරි නිමවී සවස 6.30 ට පමණ වැලිවේරිය නගරයට පැමිණි බවත් ඒ වන විට පාර අවහිර කරමින් පිරිස උද්ඝෝෂණයේ යෙදි සිටි බවත් ඇය පැමිණි ත්‍රිරෝද රථයට ඉදිරියට යාමට නොහැකි බැවින් නතර කර එයින් බැස ගත් බවයි. ඒත් සමගම වෙඩි හඩ ඇසුනු බවත් ඇය අපහසුවෙන් නිවසට ගිය බවත් එදින රාත්‍රියේ පැමිණිලිකාරියගේ පුතා නොපැමිණීම නිසා පසු දින අලුයම සිට පුතා සෙවු බවත් ප්‍රදේශයේ කිසිම තැනක ඔහු නොසිටි බැවින් රෝහල්වල පිරික්සීමේදි ගම්පහ රෝහලේ මෘත ශරීරාගාරයේ තිබියදි පුතුගේ සිරුර හදුනාගත් බවත් කියා සිටි. මරණ පරීක්ෂණය ගම්පහ රෝහලෙන් සිදුකිරීමෙන් පසුව නිවසට රැගෙන විත් අදාළ කටයුතු කළ බව කියා සිටි.

පශ්චාත් මරණ පරීක්‍ෂණ වාර්තාවේ සඳහන් තොරතුරු අනුව මොහු වයස අවු : 17 ක පමණ අයෙකු වන අතර, 2013.08.01 වන දින ප.ව 7.15 ට පමණ මරණය සිදුවී ඇත. පශ්චාත් මරණ පරීක්ෂණය 2013.08.02 වන දින පෙ.ව 10.40 ට අධිකරණ වෛද්‍ය නිලධාරි එස්.පි.ඒ.හේවගේ මහතා විසින් ගම්පහ දිස්ත්‍රික් රෝහලේදි පවත්වා ඇත. මියගිය අයගේ සිරුරේ තුවාල හදුනා ගැනීම සහ මරණයට හේතු වු කරුණු දක්වා ඇත.

External injuries.

1. A slightl oval shaped perforating laceration measuring 0.9x0.8cm was situated on the back of the right side of the trund 15.5cm away from the midline of the back of the body and 127cm above the heel. Margin as abraded. There was no burning, blackening or tattooing around the wound. Injury had penetrated the chest cavity through the 8$^{th}$ intercostals space fracturing the 9$^{th}$ rib. Thereafter injury had extended upwards and to the font of the left side of the chest through the lower part of the lower lobe of right lung, upper surface of the right lobe of the liver, right dome of the diaphragm, pericardium, heart, upper part of the lower lobe of the left lung. 4$^{th}$ inter costal space fracturing the 5$^{th}$ rib in left side of the chest and connected with the injury no.2 mentioned below.

2. An oval shaped perforating laceration measuring 2x1.5cm was situated on the front of the left side of the chest 15cm away from the midline and 139cm above the heel. There was no burning, blackening or tattooing around the wound. Pieces of soft tissues of chest cavity was found coming out through the injury.

3. A grazed abrasion measuring 08x01cm was situated on the left side of the forehead 178cm above the heel.

4. A grazed abrasion measuring 04x01cm was situated on the left temple 173cm above the heel.

5. An abrasion measuring 03x01cm was situated on the root of the nose 172cm above the heel.

6. A laceration measuring 1cm was situated on the left side of the forehead 1cm away from the midline and 175cm abov the heel.

7. A grazed abrasion measuring 1x1cm was situated on the right temple 170cm above the heel.

8. A laceration measuring 1.5cm was situatd on the right forehead 5cm away from the midline and 174cm above the heel.

9. An abrasion measuring 01x01cm was situated on the chin.

10. An abrasion measuring 02x01cm was situated on the right shoulder joint.

11. An abrasion measuring 03x01cm was situated on the left loin 2cm away from the midline and 108cm above the heel.

12. An abrasion measuring 2x01cm was situated on the back of the left upper arm 3cm above the elbow joint.

**මරණයට හේතුව : - ගිනි අවියකින් නිකුත් වු උණ්ඩය තුළින් පපු ප්‍රදේශයට හා උදරයට සිදුවු හානි තුළින් මියගිය බව දක්වා ඇත.**

**නිලන්ත පුෂ්පකුමාර යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව හා ඊට අදාළ කරුණු :-**

**පශ්චාත් මරණ පරීක්‍ෂණ වාර්තාවේ සඳහන් තොරතුරු අනුව මොහුගේ වයස අවු : 29 ක පමණ අයෙකි. මරණය සිදුවී ඇත්තේ 2013.08.04 වන දින ප.ව 12.41 ට පමණ වේ. මරණ පරීක්ෂණය 2013.08.05 දින ප.ව 1.30 ට අධිකරණ වෛද්‍ය නිලධාරී ශ්‍රියන්ත අමරරත්න මහතා විසින් කොළඹදී පවත්වා ඇත.**

Injuries

1. Abraded contusion of the Scalp. 6 x 5 cm, was found on top of the head. Large Subscalpar contusion was found over frontal, bitemporal and biparietal areas. Coronally placed, sutured surgical incision, 30cm, between left to right temporal areas, over both parietal areas was found crossing the mid line and was associated with left black eye. Underlying depressed, comminuted fractures of frontal, biparietal, and bitemporal bones were found. Frontal, biparietal and bitemporal bone fragments had been removed and the torn dura had been replaced by an artificial surgical dura by the surgeon. Reaming fractures of the skull showed arrest of two fracture lines on the left parietal area and one on the rights parietal area. Remnants of evacuated extradural haemorrhage (EDH) was evident. Underlying diffuse subdural haemorrhage (SDH) was found over both cerebral hemispheres. Underlying focal subarachnoid haemorrhage (SAH) of both parasagittal area of the parietal lobes of the brain was found with thin diffuse SAH. Brain showed flattening of gyri and narrowing of sulci (evidence of massive cerebral oedema). Biparietal (left more than right) cerebral lacerations, contutions and necrosis were found with bilateral Intra-ventricular haemorrhages. Midline of the brain was shifted towards right.

2. Sutured surgical incision, 1cm on the right parietal area (for insertion of the drainage tube)

3. Transversely placed “C” shaped, imprint patterned contusion, 3 x 6cm was found on the left buttock. Underlying deep muscle contusions was evident.

4. Contusion 10 x 8 cm on the left side of the back of the mid chest was found. The center was 12cm below the shoulder and 7cm from the midline. Underlying deep muscle contusions were found.

**Couse fo deth :-** Cranio-cerebral injuries due to Blunt force trauma to the head Caused by a blunt weapon/s.

Comments

1. there were two contusions on the trunk. One was over the back of the left buttock and the other was on the back of the left chest.
2. the contusion over the let buttock was a patterned tramline contusion.
3. head injuries are necessarily fatal.

පශ්චාත් මරණ පරීක්ෂණයට අනුව මෙම මරණය සිදුවී ඇත්තේ මොට ආයුධයකින් හිසට කරණ ලද පහරදීමක් හේතුවෙන් බවට වාර්තාවී ඇත.

**තුවාලකරුවන් පිලිබඳ විස්තර සහ අධිකරණ වෛද්‍ය වාර්තා :-**

උද්ඝෝෂණය විසුරුවා හැරීමේදී වෙඩි වැදීම සහ පහරදීමට ලක්වූ පුද්ගලයන් 36 දෙනෙකු ගම්පහ, වතුපිටිවල, උඩුපිල, කොළඹ යන රෝහල් වල ප්‍රථිකාර ලබා ඇත. ඊට අමතරව එක් පොලිස් නිලධාරීයෙකු ද හමුදා සෙබලුන් 5 දෙනෙකු ද රෝහලේ ප්‍රථිකාර ලබා ඇත.

ඉහත සඳහන් තුවාල කරුවන්ට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තා කොමිෂන් සභාව විසින් කැඳවන ලදී. එම වෛද්‍ය වාර්තා අනුව ගිනි අවිවලින් **වෙඩි තැබීමෙන් ඇතිවූ බරපතල තුවාල ලැබූවන් 10 දෙනෙකු** වාර්තා වී ඇති අතර, තියුණු හා මොට ආයුධ වලින් පහරදීම නිසා බරපතල තුවාල වූවන් සහ අස්ථි බිඳීම්, දත් ගැලවීම් සහ තැලීම් සීරීම් සහිත පුද්ගලයන් හඳුනාගෙන ඇත. රෝගීන් විසින් ලබාදෙන ලද රෝග ඉතිහාස සමග සිදුව ඇති තුවාල ගැලපෙන බව වෛද්‍ය වාර්තා අනුව පැහැදිලි වේ. තුවාලකරුවන්ගේ නාම ලේඛනය හා වෛද්‍ය වාර්තාවල අඩංගු කරුණු පහත පරිදි වේ.

| රෝහල | රෝගියාගේ නම | ලිපිනය | වයස |
|---|---|---|---|
| ගම්පහ | ටී.ඩී.ගිහාන් ශාන්ත | නො : 588/ඒ, නැදුන්ගමුව, ගම්පහ | අවු : 16 |
| | එම්.ඩී.බැක්ටික් චාමික | නො : 51/ඒ, වැලිවත්ත, වැලිවේරිය | අවු : 19 |
| | කේ.සී.පෙරේරා | නො : 416/56, පිංකොටවත්ත, වැලිවේරිය | අවු : 43 |
| | ආර්.ඩී.සුමිත් චන්ද්‍රසේකර | නො : 76/15, ගල්ඹලුව, වැලිවේරිය | අවු : 27 |
| | ඩබ්.ඩී.තිලකරත්න | නො : 28/1/ඒ, වැලිවේරිය | අවු : 21 |
| | කේ.ඩබ්.ජයරත්න පෙරේරා | නො : 45, පල්ලියවත්ත, වැලිවේරිය | අවු : 41 |
| | ජේ.චින්තක පෙරේරා | නො : 78/04, නැදුන්ගමුව, ගම්පහ | අවු :22 |
| | ලියුෂාන් හේමචන්ද්‍ර | නො : 22/05, ඌරුවෙල, වැලිවේරිය | අවු : 22 |
| | බී.සුපුන් ලක්මාල් | නො : 290/03, ඇඹරලුව - උතුර, වැලිවේරිය | අවු : 16 |
| | බී.කේ.අපොන්සු | නො : 142/ඒ, වැලිවේරිය | අවු : 32 |
| | ප්‍රසන්න පෙරේරා | නො : 58/01, ජයලත් නිවස, වැලිවේරිය | අවු : 45 |
| | ක්‍රිස්ලි පෙරේරා | නො : 560/04, නැදුන්ගමුව, ගම්පහ | අවු : 56 |
| | කේ.එස්.පෙරේරා | නො : 46/03, වැලිවත්ත, වැලිවේරිය | අවු : 40 |
| | එස්.ඒ.ප්‍රේමතිලක | නො : 416/216, පිංකොවත්ත, වැලිවේරිය. | අවු : 34 |
| ගම්පහ | කේ.කේ.සුනිල් | නො : 351, කල්‍යාණි මාවත, වැලිවේරිය | අවු : 54 |
| | වී.ප්‍රියදර්ශන ඩයස් | නො : 353/03, කල්‍යාණි මාවත, වැලිවේරිය | අවු : 47 |
| | පී.ජගත් විරාජ් | නො : 360/02, රණවිරු නිශාන්ත පෙරේරා මාවත, වැලිවේරිය | අවු : 50 |
| වතුපිටිවල | ඩබ්.පී.සුරංජිත් විජේසිංහ | නො : 39/13/01, තෙන්නකොන්වත්ත, වැලිවේරිය | අවු : 29 |
| | ඩබ්.ආර්.කැලුම් ප්‍රියනන්ද | නො : 32/02, පල්ලිය වත්ත, වැලිවේරිය | අවු : 27 |
| | ශාන්ත දිනේෂ් | පිංකෝවත්ත, වැලිවේරිය | අවු : 45 |
| | බී.ජෝෂප් ප්‍රියන්ත | නො : එලන්වත්ත පාර, වැලිවේරිය | අවු : 42 |
| | රවිරාජ් පෙරේරා | - | අවු : 19 |
| | එන්.එන්.නිශාන්ත | පිංකොවත්ත, වැලිවේරිය | අවු : 32 |
| | දුමිදු දිලංජන | ඇටිකෙහෙල්දල්ල, වැලිවේරිය | අවු : 21 |
| | දිල්ෂාන් සමර | නො : 173, උඩුපිල, දෙල්ගොඩ | අවු : 34 |

| | | | |
|---|---|---|---|
| උඩුපිල ග්‍රාමීය රෝහල | මනෝජ් ප්‍රසන්න | විරකොටිවත්ත, වැලිවේරිය | |
| | උමේෂ් කුමාර සිල්වා | නො : 419/14, ඇඹරලුව, වැලිවේරිය | |
| | උපාලි | නො : 152/ඩී, උඩුපිල, දෙල්ගොඩ | |
| | මහගමගේ ලලිත් කුමාර | නො : 41, කහටාන, හේනේගම | |
| රාගම | කේ.ඩබ්.බුද්ධික සපිත් | නො : 145/11, වලව්වත්ත, වැලිවේරිය | |
| | බී.පී.ජයවර්ධන පෙරේරා | නො : 175/1, වල්බෝව, පෙතියාගොඩ | |
| | ජ්.ඒ.සංජිව | නො : 152, ගලගෙදර, හිදගල | |
| | ටී.පී.සංජිව කුමාර | නො : 10/02, මැදගම, කොටපොල | |
| | එච්.එම්.නුවන් භාරත | එගොඩවත්ත, ඉහල බද්දේගම, බදුල්ල | |
| | ජයසම්පත් උදේෂ් කුමාර සිල්වා | නො : 419/05, ඇඹරලුව - දකුණ, වැලිවේරිය | |
| | පද්මා ජේඩ් ගෙදර නන්දසේන | නිරෝෂ් බේකරිය, වැලිවේරිය | |

**තුවාල ලැබූ පොලිස් නිලධාරීන් හා යුද හමුදා නිලධාරීන් :-**

| රෝහල | රෝගියාගේ නම | ලිපිනය |
|---|---|---|
| කොළඹ ජාතික රෝහල | පො.ප උපාලි | ස්ථානාධිපති, පොලිස් ස්ථානය, වැලිවේරිය |
| රාගම රෝහල | කෝප්‍රල් 00272 පාලිත | දෙල්ගොඩ යු/හ කඳවුර |
| | කෝප්‍රල් 321091 සුජිව සමන් කුමාර | දෙල්ගොඩ යු/හ කඳවුර |
| | කෝප්‍රල් 400858 ඩී.දිසානායක | වැලසිර යු/හ කඳවුර |
| | කෝප්‍රල් 10465 එම්.ඒ.අජිත් සුභසිංහ | වැලිසර යු/හ කඳවුර |
| | කෝප්‍රල් 401294 පී.ඩබ්.පියල් චන්දන | දෙමටගොඩ යු/හ කඳවුර |

## 01. **එම්.ඒ.ප්‍රියදර්ශන ඔයස් යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:**

කොමිෂන් සභාවට ලබාදුන් ප්‍රකාශයේ සඳහන් කරුණු :

මොහු ප්‍රකාශ කර ඇත්තේ කළු පැහැති යුද හමුදා ඇඳුමට සමාන ඇඳුම් ඇඳගත් පිරිසක් පහරදුන් බවත්, එක් අයෙකු තමාගේ හිස පිටුපසට පහරදුන් බවත් පසුව තම පිටට පහරවල් තුන හතරක් ගැසූ බවත්ය.

අධිකරණ වෛද්‍යවරයාට ලබාදුන් රෝග ඉතිහාසය :

හමුදා නිලධාරීන් ලී පොල්ලකින් හා අතින් පහරදුන් බව

අධිකරණ වෛද්‍ය වාර්තාවට අදාළව දක්වා ඇති තුවාල :

01. හිසේ වම් පස පිහිටි 4 cm x 4 cm වූ තැලීම් තුවාලය
02. වම් පස උරහිසේ පිටුපස වූ 5 cm x 13 cm වූ ට්‍රැම්ලයින් තැලීම් තුවාලය
03. පපුවේ පිටුපස වම් පසට වන්නට වූ 7 cm x 13 cm වූ ට්‍රැම්ලයින් තැලීම් තුවාල
04. උදරයේ පිටුපස ඇඳවී පිහිටි 6 cm x 13 cm තරම් වූ ට්‍රැම්ලයින් තැලීම් තුවාල

එම තුවාල හතරම මොට ආයුධයකින් සිදුකර ඇති බව තවදුරටත් දක්වා ඇත.

( 1 Contñion, 4cm x 4cm placed on the left side of head. 2 Tram line Contusion, 5cm x 13 cm placed on back of the left shoulder.3 Tram line Contusion, 7cm x 13 cm placed on back of left side of the chest. 4 Tram line Contusion 6cm x 13 cm placed obliquely on back of the abdomen.)

## 02. **පී.කිංස්ලි පෙරේරා යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:**

කොමිෂන් සභාවට ලබාදුන් ප්‍රකාශයේ සඳහන් කරුණු :

හමුදා නිලධාරීන් වෙඩි තබන විට තමාගේ කකුලට වෙඩි පහරක් වැදුනු බවත්, කටට ගලකින් ගැසූ බවත් පැමිණිල්ලේ දක්වා ඇත.

අධිකරණ වෛද්‍යවරයාට ලබාදුන් රෝගි ඉතිහාසය :

* හමුදා නිලධාරියෙකු ලී පොල්ලකින් පහරදී ටී 56 කින් වෙඩි තැබූ බව

අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් තුවාල :

* පහළ තොල් පටයට 1.5 cm පහළින් 2 cm තරම් වූ ඉරීම් තුවාලයක්
* දකුණු දණහිසේ දණහිස් සංධියේ ඉහළ දාරයේ සිට 9cm ඉහළින් 3cm තරම් වූ ඉරීම් තුවාලයක් (කලවේ වෙඩි උණ්ඩයක් ඇති බව X කිරණ පරීක්ෂණයේදී දක්නට ඇති බව දක්වයි)

ඉහත පළවන තුවාලය මොට ආයුධයකින් හා දෙවන තුවාලය ගිනි අවියකින් සිදුකර ඇති බව දක්වා ඇත.

Nature of Injury

01. 2cm laceration placed transversel on the chin 1.5cm below to lower lip.
02. 3 cm Laceration placed on the lateral aspect of the right thigh 9cm above to upper border of knee cap. Another 4cm incision parallel and behind to laceration was made for surgical removal of bullet. (x-ray shows bullet in the thigh)

පැමිණිලිකරු අධිකරණ වෛද්‍යවරයාට ලබාදුන් රෝගී ඉතිහාසයේ ගිනි අවියකින් තුවාල කිරීමත්, පොල්ලකින් පහරදීමත් දක්වා ඇති නමුදු කොමිෂන් සභාවේ දක්වා ඇත්තේ කටට ගලකින් ගැසූ බවයි.

## 03. බලගෙදර සුපුන් ලක්මාල් යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:

කොමිෂන් සභාවට ලබාදුන් ප්‍රකාශයේ සඳහන් කරුණු :

හමුදා නිලධාරියෙක් වෙඩි තැබූ බවත් එම වෙඩි පහර තම වම් කකුලට වැදුනු බවත් දක්වා සිටියි.

අධිකරණ වෛද්‍ය නිලධාරියාට ලබාදුන් රෝගී ඉතිහාසය :

* හමුදා නිලධාරියෙකු වෙඩි තැබූ බව

අධිකරණ වෛද්‍ය වාර්තාවේ දක්වා ඇති තුවාල

01. 2 cm X 1 cm පිපුරුණ සිරීමක් lateral malleolus ට 4cm ඉහලින් හා 2 X 3cm අසමාන සිරීමක් lateral malleolus වලට 4 cm ඉහලින් තිබීම මෙම තුවාලයෙන් වෙඩි උණ්ඩය ඇතුලු වීම හා පිට වීම සමග සැසදෙන බව දක්වා ඇත.

02. දකුණු Fibula අස්ථියේ පහල කොටසේ යටින් වූ භග්නයක්/1 හා 2 තුවාල ගිනි අවියකින් සිදුවූ තුවාල ලෙස දක්වා ඇති අතර, දෙවන ගණයේ තුවාලය බරපතල තුවාල ලෙස දක්වා ඇත.

Nature of Injury

1. 2x1cm split laceration 4cm above to lateral malleolus and irregular 2x3cm laceration 4cm above to lateral malleolus these injuries are compatible with entry and exit of the bullet.
2. And underlying fracture of lower end of right fibula.

## 04. කේ.ටී.කේ.ප්‍රේමලාල් පෙරේරා යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:

අධිකරණ වෛද්‍යවරයාට දැක්වූ රෝගී ඉතිහාසය :

* හමුදා නිලධාරීන් පිරිසක් විසින් තුවක්කු වලින් පොලු හා අතින් පයින් පහරදුන් බවයි.

තුවාල තත්ත්වයන් :

* හිසේ ඉහළ කොටසේ පිටුපසට වන්නට 6 cm × 7 cm තරම් ප්‍රමාණයක වූ තැලීම් තුවාලයක්
* දකුණු ඇස වටේ තැල්මක්
* වම් ඇස වටේ තැල්මක් හා වම් ඇසේ ලේ ගැලීමක්

* පහළ තොල් පටේ ඇතුලත 1 cm ඉරීමක්
* වම් ඉහළ මුල් දත ඉවත්වී තිබීම
* දකුණු වැලම්ටේ පිටුපස 5 cm × 6 cm තරම් ප්‍රමාණයක වූ සිරීමක්
* පපුව පිටුපස දකුණු උරහිස් සංදියට පහලට වන්නට 7 cm × 5 cm තරම් වූ සිරීමක්
* දකුණු අතේ 4 වන ඇගිල්ලේ Metacarpal අස්ථියේ භග්නයක්
* දකුණු ඉනේ පිටත 5 cm × 8 cm ප්‍රමාණයක වූ සිරීමක්
* දකුණු කලවේ ඉහළ පිටත හා ඉදිරියේ 12 cm × 8 cm තරම් වූ තැල්මක්
* දකුණු කකුලේ කෙන්ඩ කොටසේ ඉහල 5 cm × 4 cm තරම් වූ සිරීමක්
* වම් කළවේ ඉදිරි හා පිටතට 7 cm × 6 cm තරම් වූ තැල්මක්

මෙහිදී 5 හා 8 දක්වා ඇති තුවාල බරපතල තුවාල ලෙස දක්වා ඇති අතරම එම තුවාල මොට ආයුධයකින් සිදු කළ තුවාල ලෙස දක්වා ඇත.

Nature of Injury

1. Contusion, 6cm x 7cm in size, was situated over the back aspect of the head near the vertex (top part of the head). There was no underlying fracture.
2. A contusion was seen aorund the right eye.
3. A contusion was seen around the left eye. There was associated subconjunctival haemorrhage in the left eye.
4. A laceration, 1cm in length, was situatd over the inner aspect of the lower lip.
5. The left upper incisor tooth was avulsed (complete dislocation).
6. A scab abrasion, 5cm x 6cm in size, was situated over the back aspect of the lower lip.
7. A scab abrasion, 5cm x 6cm in size, was situated over the back of the cheat near the lower angel of the right scapula.
8. A fracture was located in the fifth metacarpal bone of the right hand.
9. A scab abrasion, 5cm x 8cm in size, was situated over the outer aspect of the right side of the hip.
10. A contusion, 12cm x 8cm in size, was situated ver the outer and front aspect of the right upper thigh.
11. An abrasion, 5cm x 4cm in size, was situated over the shin of the right leg.
12. A contusion, 7cm x 6cm in size, was situated ver the outer and front aspect of the left thigh.

## 05. එන්.එම් නිශාන්ත යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:

අධිකරණ වෛද්‍යවරයාට ලබා දී ඇති රෝගී ඉතිහාසය :

හමුදා නිලධාරියෙකු විසින් වම් කකුලට වෙඩි තබා ඇති බව දක්වයි.

අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් තුවාල හා අනෙකුත් කාරණා :

* වම් පාදයේ Calcanius අස්ථියේ භග්නයක්

මෙම තුවාලය පරීක්ෂා කරන අවස්ථාවේ ශල්‍යකර්මයක් මගින් තුවාලය වෙනස් වී තිබීම නිසා තුවාලය පිළිබඳ නිසි කරුණු දැක්වීම අපහසු බව වෛද්‍ය වරයා දක්වා ඇත. මෙම තුවාලය බරපතල ගණයේ තුවාලයක් බව දක්වා ඇත.

1. A compound comminuted fracture of the calcanius bone of the left foot. At the time of examination the wound on the left foot had ben surgically altered. Therefore, I cannot comment whether this injury is an entry wound due to a discharge from a firearm. (compound fracture = fractured area opening to the exterior through the skin comminuted fracture = bone is fragmented into more than two parts)

**06. <u>ශාන්ත ඩැනියෙල් / දිනේෂ් යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:</u>**

රෝගියාට කෘතිම ශ්වසන දි තිබිම නිසා රෝගි ඉතිහාසය දැක්වීමට නොහැකිව ඇති බව වෛද්‍ය වාර්තාවේ දක්වා ඇත.

වෛද්‍ය වාර්තාවට අනුව තුවාලයන්හි ස්වභාවය

- * වමට බරව පහලට තොල්පට තුළින් මෙම උණ්ඩය ඇතුල් වී ඇති බවත් එමගින් මෘදු පටක මුහුණේ මස් පිඩු, දිව තුළ, ඉරිම් ඇති කර ඇති බවත් වම් අධෝහනුව පසාරු කොට ගෙන maxilla අස්ථිය හානි කරමින් දකුණු ඉහළ මුහුණ තුළින් උණ්ඩය පිටතට ගමන් කර ඇති බව දක්වා ඇත.
- * වම් උදරයේ උණ්ඩය ඇතුල් වී උදර කුහරය තුලටම කිදා බැස තිබීම හේතුවෙන්

මෙහිදි මරණය සිදුකිරිමට ප්‍රමාණවත් තුවාල ඇති බව දක්වා ඇත.

<u>Nature of injury</u>

1. Entry rifle firearm wound situated over the left lower lip associated with laceration to soft tissue, fascial muscles tongue and fracture to left mandible. Missile has traveled upwards and outwards to right infra orbital region resulting in right fascial bone fracture (maxilla bone). Making an exit in right upper face.
2. Entry firearm wound situated over the left outer abdomen, associated with posterior abdominal contusion, which penetrated to the abdominal cavity (for which abdominal surgery was performed) resulting in upper descending bowel contusion Small shrapnel was found at the extra peritoneal cavity.
   Medical notes revealed that during admission to NHSL patient was unconciosness. Glasgo Coma Scale was – 3/15.

**07. <u>සතරසිංහ ආරච්චිලාගේ ඩෙරික් ප්‍රේමතිලක යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:</u>**

පොලු වලින් තමාගේ නලලට නාසයට සහ ඇගට පහරදුන් බවත් දක්වා සිටියි.

<u>අධිකරණ වෛද්‍යවරයාට දැක්වූ රෝගි ඉතිහාසය :</u>

හමුදා නිලධාරියෙකු ලී පොල්ලකින් තම අත්වලට හිසට හා මුහුණට පහරදුන් බව දක්වා ඇත.

<u>අධිකරණ වෛද්‍ය වාර්තාවට අදාළව :</u>

01. නලලලේ දකුණු පසට වන්නට 5 cm දිගින් වු පැල්මක්
02. දකුණු ඇසට පහලින් 2 cmx 3 cm වු තැල්මක්
03. වම් ඇසට පහලින් 4 cm x 3 cm වු තැල්මක්
04. නාසයේ පොල්ල මත 1 cm X 1 cm වු තැල්මක් හා නාස් පොල්ලේ පැල්මක්

<u>Nature of Injury</u>

1. Sutured linear laceration, 5cm, transversely plaed on right side of the forehead.
2. Contusion, 2 x 3cm placed on bellow to right eye.
3. Contusion, 4 x 3cm placed on bellow to left eye
4. Contusion, 1 x 1cm placed on the nasal bridge with underline fracture of nasal bone.

මෙහිදි 4 වන තුවාලය බරපතල ඝනයේ තුවාල ලෙස දක්වන අතර, මොට ආයුධයකින් සිදුකල තුවාලයක් ලෙස දක්වා ඇත.

අතෘප්තියට පත් තැනැත්තා දැක්වු පහරදිම් ආකාරය හා තුවාල ගැලපෙන බව නිරික්ෂණය වේ.

## 08. සුසන්ත රෝහණ පෙරේරා යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:

<u>කොමිෂන් සභාවට ලබාදුන් ප්‍රකාශයේ සඳහන් කරුණු :</u>

හමුදා නිලධාරීන් හා මහජනයා හා බහින් බස්වනවා දුටු බවත්, එහිදි හමුදාව තම ආයුධ උස්සන අයුරු දුටු බවත්, එහිදි දිවයාමට හැරුණු විට තම පිට පසාරු කොට වෙඩි වැදුනු බව දක්වයි.

<u>අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව,</u>

ගිනි අවියකින් තුවාල සිදුව ඇති බව දක්වයි.

* පපුවේ පිටුපස වම් පසට පහලින් ගිනි අවියකින් තුවාලයක් තිබිම හා එය ඉදිරිපස පපුවේ ඉහළ කොටසින් පිටතට ගොස් ඇති බවත්, මෙමගින් පපු කුහරය තුළ(Haemothorax) ලේ ගැලීමක් සිදුව ඇති බව දක්වා ඇත.
* ඒ අතරම මෙම තුවාල සාමාන්‍ය තත්ත්වය යටතේ මරණය සිදුකිරීමට ප්‍රමාණවත් තුවාල බව දක්වා ඇත.

ඒ අනුව අතෘජතියට පත් තැනැත්තාගේ රෝගී ඉතිහාසය හා තුවාල අතර සම්බන්ධතාවයක් ඇති බව නිරීක්ෂණය වේ.

<u>Nature of Injury</u>

1. Entry firearm wound measuring 1.5cm situated over the back of left lower chest. This missile had entered into the chest cavity resulting in bleeding into the chest cavity. (Haemothorax) has traveled to from to from and upwards.
2. Exite firearm wound measuring 1.5cm situated over the left front upper chest.
   Inter costal tub was inserted to manage the haemothorax.

## 09. කෝරලගමගේ මෙලන් පෝලා චින්තක පෙරේරා යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:

හමුදා නිලධාරීන් විසින් වෙඩි තැබීමේදි තමාගේ දකුණු තට්ටමට වෙඩි පහරක් වැදුනු බව දක්වයි.
<u>වෛද්‍ය වාර්තාවට අනුව දැක්වෙන තුවාල</u>

තුවාල 03 ක් දක්වා ඇති අතර, එය ගිනි අවියකින් සිදුවු තුවාල බවට වෛද්‍ය මතය ඉදිරිපත් කර ඇත.

* දකුණු පස පහල තට්ටම් ප්‍රදේශයේ රවුම් (Penetraing) ආකාරයට ඇතුළු වු 1 cm ඉරීමක්
* දකුණු Fermur Neck හි පැල්මක්
* දකුණු Groin area තුළ වු අසමාන ඉදිම්මක්

<u>Nature of Injury</u>

At the time of examination,

1. He was conscions and rational to respond to question
2. He was haemodynamically stable.
3. The following injuries were observed.ENTRY- A circular penetrating laceration on the back of the swlower trunk (badtock) measuring lem diameter with underlying wound tract cañing,Fractured neck of the right femur,EXIT – an irregular laceration over the right inguinal region (groin)Necessitating WOUND CARE uder ANAESTHESIA and IV – ANTIBIOTIS and TRATION APPLICATION FOR RIGHT LOWER LIMB.

10. **<u>දේවේන්ද්‍ර ගමගේ ජයවර්ධන පෙරේරා යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:</u>**

හමුදා නිලධාරින් 30 දෙනෙකු පමණ ප්‍රමාණයක් පොලු වලින් පහරදී, බිම ඇද වැටුනු පසු පාගමින් පහරදුන් බව දක්වයි.

අධිකරණ වෛද්‍යවරයාට ලබාදුන් රෝගි ඉතිහාසයේද පොලු වලින් හිසට ඉහළ හා පහලට පහරදුන් බව දක්වයි.

<u>අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව :</u>

* නලලේ දකුණු ප්‍රදේශය 1.5 cm වු ඉරීමක් (දාරිත)
* නලලේ මැද 2 cm වු ඉරීමක් (දාරිත)
* දකුණු ඇහි බැමේ 3 cm වු ඉරීමක්(දාරිත) දක්නට ඇති බව දක්වයි.

එම තුවාල මොට ආයුධයකින් සිදුකළ තුවාල බව දක්වා ඇති අතර, බරපතල නොවන තුවාල බවද දක්වයි.

ඒ අනුව අතෘප්තියට පත් තැනැත්තා දක්වන පහරදී ඇති ආකාරයත් තුවාල ආකාරයත් සැසදෙන බව නිරික්ෂණය වේ.

Nature of Inqury Laceration 1.5cm in size over the right side of the forehad 2cm from midline and 3cm from ® ey brow.

11. **<u>හෙන්නායක මුදියන්සේලාගේ නුවන් තාරක තිලිනපිත් යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:</u>**

<u>රෝගියා විසින් අධිකරණ වෛද්‍යවරයාට ලබාදුන් රෝගි ඉතිහාසය :</u>

ඔහුගේ හිසට, පිටුපපසට හා දකුණු කකුලේ ඉහල Limb ප්‍රදේශයට පොලුවලින් පහරදීම් කළ බව දක්වා ඇත. ඒ අනුව පහරදුන් ආකාරය හා තුවාල හා සැසදෙන බව පෙනි යයි.

අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව මොට ආයුධයකින් සිදුකල තුවාල 06 ක් දක්වා ඇත.

01. දකුණු කණේ ඉහල කොටසේ සිට 6 cm ක් ඉහලින් හිසේ දකුණු පස Crescent හැඩති 4 cm වු ඉරීමක් (දාරිත)
02. පපුවේ පසුපස වම් පස 7cmx 2.5 cm වු ට්‍රැම්ලයින් තැලීමක්
03. පපුවේ පසුපස වම් පස 4 cmx 2.5 cm වු ට්‍රැම්ලයින් තැලීමක්
04. පපුවේ පසුපස දකුණු පස 6cmx 2 cm තරමේ ප්‍රමාණයක ට්‍රැම්ලයින් තැලීමක්
05. පපුවේ පසුපස දකුණු පස 5.5cm x 2 cm තරමේ ප්‍රමාණයක ට්‍රැම්ලයින් තැලීමක්
06. දකුණු අතේ වැලමිටේ සිට 4 cm ඉහලින් 2 x 4 cm ප්‍රමාණයක බරපතල සිරීමක්

01. Crescent shape 4 c.m. in size laceration over right side of the head 6 c. m. above the upper margin of the right ear.
02. Tram line contusion 7x2.5 c.m. in size situated over the left side of the back of the chest.
03. Tram line contusion 4x2.5 c.m. insize situated ver the left side of the back of the chest.
04. Tram line contusion 6x2 c.m. in size situated over the righ side f the back of the chest.
05. Tram line contusion 5.5 c.m. x 2 c.m. in size situated over the right side of the back of the chest.
06. Grace Abration 2x4 c.m. in size Situation verthe lateral aspect of the left arm 4 c. m. above the elbw joint.

## 12. කේ.වී.බුද්ධික යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:

වෛද්‍යවරයාට දුන් රෝගී ඉතිහාසය :

තමාගේ ඔළුවට, පිටට, අත් වලට හා කකුල් වලට පල්ලියේදී හමුදා නිලධාරීන් දෙදෙනෙකු පොලු වලින් පහරදුන් බව දක්වයි.

අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව :

මොට ආයුධයකින් සිදුකළ තුවාල 8 ක් දක්වා ඇත.

01. 1 cm පමණ වූ ඉරීමක් මුහුණේ වම් පස glabella වලට 8 cm ඉහලින්
02. බෙල්ලේ පහළ තීරයට වහාම පහළින් මධ්‍ය රේඛාවට 15 cm ක් දුරින් මැද ලක්ෂයේ පිහිටියා වූද පපුවේ පසුපස වම් පස 2 cm x 8 cm තරම් ප්‍රමාණයක වූ ට්‍රැම්ලයිම් තැලීමක්
03. වම් වැලමිට සංන්ධියේ පිටුපස 8 cm x 4 cm ප්‍රමාණයක වූ තැලීමක්
04. බෙල්ලේ පහළ තීරයට 2 cm වාහම පහළින් දකුණුපස පපුවේ පිටුපස දකුණු පස 20 cm x 20 cm ප්‍රදේශයක වූ බහුවිද ට්‍රැම්ලයින් තැලීම් තුවාලයන්
05. ඉන ප්‍රදේශයේ සිට 40 cm ඉහළින් පපුවේ පිටුපස දකුණු පස 8 cmx 3 cm වූ තැල්මක්
06. දකුණු අතේ ඉදිරි ඇඟිල්ලේ පසුපස metacorpo – phalangeal joint එකට 4 cm ඉහලින් 4cm x 3 cm තරම් වූ තැල්මක්
07. දකුණු අතේ ඉදිරි ඇඟිල්ලේ පසුපස metacorpo – phalangeal joint එකට 4 cm ක් ඉහලින් 05cm x 05 cm තරම් වූ සිරීම් තුවාලයක්
08. දකුණු දණ හිස් සන්දියට වන්නට ඉහලින් පහළlimb හි පසුපස 6cm x 2 cm තරම් වූ ට්‍රැම්ලයින් තැලීම් තුවාලයක්

ඒ අනුව තුවාල ලත් තැනැත්තා දක්වා ඇති පහරදුන් ආකාරය හා රෝගී ඉතිහාසය සැලකීමේදී වෛද්‍ය වාර්තාවේ තුවාල හා එම ඉතිහාසය සැසදෙන බව නිරීක්ෂණය වේ.

Nature of Injury

01. Laceration 1cm in length situated on the left side of the face (Just lateral to midline) 8cm above the glabella.
02. Tram line Contusion 2x8cm in size situated on the posterior aspect of the left side of the chest mid point situated 15 cm lateral to mid line and Just below the lower margin of neck.
03. Contusion 8x4cm in size, situated ovr the posterior lateral aspect of left elbow joint.
04. Multiple tram line Contusion, situated in an area of 20x20 cm over the right posterior chest upper margin situated 2cm below the lower magin of neck.
05. Contusion 8x3cm in size situated over the right side of posterior chest 40cm above the waist line and 20cm lateral to mid line.
06. Contusion 4x3cm in size, situated over the dorsal aspect of the right hand 4cm above the metocorpo – phalangeal joint of fore finger.
07. Abrasion 0.5x0.5cm situated over the dorsal aspect of right hand 4cm above the metocorpo – phalangeal joint of fore finger.
08. Tram line Contusion 6x2cm in size situated over the postero- lateral aspect of right lower limb Joint abovethe knee joint.

**13. එදිරිවීර ආරච්චිලාගේ අමිල සංජීව යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:**

හමුදා නිලධාරීන් තුවක්කු බදෙන්, පොලුවලින් හා බූට් සපත්තු වලින් පහරදුන් බවත්, දකුණු කකුලේ දණහිසට බූට් සපත්තු පහරක් වැදුනු බවත් දක්වා ඇත.

<u>අධිකරණ වෛද්‍ය වාර්තාවට අදාළ තුවාලයන්හි ස්වභාවය :</u>

මොට ආයුධයකින් සිදුකල තුවාල දෙකක් දක්වා ඇත.

* 4 x 2 cm පමණ තැලීමක් දකුණු ඇසට පහලින් මුහුණේ දකුණු පස.
* 2 x 2 cm තරම් ඉරීම් (දාරික) මුහුණ දකුණ පස කණ අසල පස.

මෙහිදි රෝගියා වෛද්‍යවරයාට ලබාදුන් රෝගි ඉතිහාසයේ රයිෆලයකින් මුහුණේ දකුණු පසට පහරදුන් බව දක්වා ඇත. ඒ අනුව රෝගි ඉතිහාසය, පහරදුන් ආකාරය, සිදුවී ඇති තුවාල හා සැසඳේ.

<u>Nature of Injury</u>

01. Contusion 4x2cm in size situated over the right side of the face Just below the right eye.

02. Contusion 2x2cm in size situated over the right side of the head Just behind the ear.

**14. පී.පී ශ්‍රීමාල් මධුශංඛ කරුණාරත්න යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:**

තමාට හමුදා නිලධාරීන් පොල්ලකින් හා විදුරු බෝතලයකින් පහරදී බිම දිගේ ඇදගෙන ගිය බවත්, තමා හිස් වැස්මක් පැළඳගෙන සිටියදී පහරදීම නිසා එය කැඩී හිස තුවාල වූ බවත් කොමිෂන් සභාවේදී දක්වන ලදී.

<u>අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව :</u>

රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසයේ හමුදා නිලධාරියෙකු විසින් ලී පොල්ලකින් පහරදුන් බවත් බෝතලයකින් පහරදීම් කළ බවත් දක්වා ඇත.

<u>අධිකරණ වාර්තාවේ දක්වන ලද තුවාල :</u>

මොට ආයුධයකින් පහත දැක්වෙන තුවාල 4 සිදුවී ඇති බව දක්වයි.

* හිස මුදුනේ මැද රේඛාවේ 1 cm පමණ වූ ඉරීමක්
* වම් කණට 1 cm පසුපස හිසේ වම් පැත්තේ 2 cm x1 cm වූ සිරීම් තුවාලයක්
* මධ්‍ය රේඛාවේ සිට 13 cm 1 ක් දකුණු පස තුනටියේ 10 cm x 10 cm අසමකාර සීරීම් තුවාලයක්
* වම් උරහිසේ ඉහළ4 cm x 2 cm වූ තැලීමක්

<u>Nature of Injury</u>

01. Laceration 1cm placed on the top of the head at midline.
02. Abrasion 2x1cm placed on left side of the head 1cm behind to left ear.
03. 10x10cm irregular gazed abrasion on the lateral side of the right loin 13cm from mid line.
04. Contusion, 4x2cm placed on top of the left shoulder.

ඒ අනුව රෝගී ඉතිහාසයේ සහ තුවාල අතර සම්බන්ධතාවයක් ඇති බව පෙනියන්නේ පැමිණිලිකරු දක්වන පහරදුන් ස්ථාන වල තුවාල ඇතිවී තිබෙන නිසාත් පහරදී ඇත්තේ මොට ආයුධයකින් වන බවයි.

## 15. <u>වයි.පී.දුමිඳු දිලංජන යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:</u>

<u>කොමිෂන් සභාවට ලබාදුන් ප්‍රකාශයේ සඳහන් කරුණු :</u>

පල්ලියේදී හමුදා නිලධාරීන් පොළු වලින් පහරදුන් බවත්, තමාගේ හිසට පොලු පහරක් වැදුනු බවත්, දෙවනවර එම පහරදීම වලකාලීමට අත් එසවූ විට අතට වැදුනු බවත්, පසුව තමාට නැවත අතින් පයින් ගැසූ බවත් දක්වා සිටින අතර, පසුව දිවීමේදී නැවත පොළු වලින් පහර දුන් බවත් එසේ දිවීමේදී කාණුවකට වැටුනු බවත්, එහිදී හමුදා නිලධරීන් තමා කාණුවෙන් එළියට ගෙන නැවත පහරදුන් බවත් දක්වා සිටී.

<u>අධිකරණ වෛද්‍යවරයාට ලබාදුන් රෝගී ඉතිහාසය :</u>

හමුදා නිල ඇඳුමින් සැරසී සිටි පුද්ගලයන් පොල්ලකින් හා ආයුධ වලින් සහ පයින් ගැසූ බව දක්වා ඇත.

<u>අධිකරණ වෛද්‍ය වාර්තාවේ සඳහන් තුවාල :</u>

* හිස් කබලේ වම් කණට ඉහළින් 8 cm දිග ඉරීමක් වේ. එම ඉරීම මොට ආයුධයකින් සිදුකර ඇති බව දක්වන අතර, දකුණු අතේ මැදගිල්ලේ අස්ථි භග්නයක් ඇති බවත්, එය බරපතල තුවාලයක් බවත් දක්වා ඇත.

<u>Nature of Injury</u>

Laceration on the left aspect of scalp above the left ear, 8cm long, inflicted by a blunt weapon.

ඒ අනුව පැමිණිලිකරු සඳහන් කර ඇති ආකාරයට හිසට පොල්ලකින් පහරදීම හා පහර වැලැක්වීමේදී අත යොමු කිරීම නිසා අතට වැදීම තුළින් ඉහත තුවාල සිදුවිය හැකි බව අවධානයට ලක් වන අතරම එම පහරදෙන ආකාරය හා තුවාල සැසඳෙන බව තවදුරටත් නිරීක්ෂණය වේ.

## 16. <u>වී.වී.ශසික පියුෂාන් හිමංග යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:</u>

<u>කොමිෂන් සභාවට ලබාදුන් ප්‍රකාශයේ සඳහන් කරුණු :</u>

නිවසට ඒමේදී හතරමං හන්දියේදී දකුණු කලවට වෙඩි පහරක් වැදුනු බවත් දක්වා සිටී.

<u>අධිකරණ වෛද්‍යවරයාට ලබාදී ඇති රෝගී ඉතිහාසය :</u>

හමුදා නිලධාරියෙකු විසින් වෙඩි තැබූ බවයි.

අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව ගිනි අවියකින් සිදුවූ තුවාලයක් ඇති බවත්, එය දකුණු කලවේ ඉහළින් 12cm x 5 cm තරමේ වූ ඉරීමක් ඇති කර ඇති බවත් දක්වා ඇත. මෙහිදී රෝගියාගේ රෝගී ඉතිහාසය හා තුවාල සැසඳෙන බව පැහැදිලිව නිරීක්ෂණය වේ.

Nature of Injury

Laceration 12x5cm placed on the medial aspect of right upper thigh.

## 17. කේ.කේ.ඩී.සුනිල් ජෝශප් යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:

කොමිෂන් සභාවට ලබාදුන් ප්‍රකාශයේ සඳහන් කරුණු :

පල්ලිය අසලදී හමුදා නිලධාරියෙකු විසින් තුවක්කුවේ බඳ කොටසින් තමාගේ ඔළුවට ගැසූ බවත්, පසුව උරහිස දෙපසටත් පහරදුන් බවත් දක්වා සිටි.

අධිකරණ වෛද්‍යවරයාට ලබාදුන් රෝගි ඉතිහාසය :

හමුදා නිලධාරියෙකු විසින් ගිනි අවියේ බඳින් පහරදුන් වග

අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව දක්වා ඇති තුවාල :

01. හිසේ මධ්‍ය රේඛාවේ සිට 3 cm ක් පිටුපසට වන්නට හිස දකුණු ප්‍රදේශයේ 9 cm ක් තරම් වූ ඉරීමක්

02. දකුණු පස temporal අස්ථිය (හිසේ) භග්නයක්, එසේම අධික ලෙස රුධිරය ගලා යාමක් සහ මොලයේ තැල්මක්

එහිදී දෙවන තුවාල ඝනය බරපතල තුවාලයක් ලෙස වර්ග කර ඇති අතර, මෙම තුවාලයන් මොට ආයුධයකින් සිදුකළ තුවාල ලෙස දක්වා ඇත. ඒ අනුව රෝගියා දක්වන පහරදුන් ආකාරයට අනුව අධිකරණ වෛද්‍ය වාර්තාවේ දක්වා ඇති තුවාල සැසඳේ.

Nature of Injury

01. Sutured laceration, 9cm placed on the right side of the head (temporal region) directed forwards and back wards 3cm from midline.
02. Underline compound fracture of right temporal bone with acute subdural Hemorrhage and cerebral contusion.

## 18. සක්කරපේඩිගෙදර නන්දසේන යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:

රෝගියා විසින් දෙන ලද රෝග ඉතිහාසය :

* හමුදා නිලධාරීන් කණ්ඩායමක් විසින් ලී පොලු වලින් හිසට, පිටුපසට හා වම් කකුලේ පහලට පහරදුන් බව දක්වයි.

අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව පහත තුවාල දක්වා ඇත.

* වම් කණ් පෙත්තට වන්නට ඉහළින් හිසේ වම් පැත්තේ 1 cm × 0.5 cm තරම් වූ මතුපිට සීරීමක්
* වම් කකුලේ Maleolus වලට 1 cm ඉහළින් 2 cm × 3 cm තරම් වූ පැහැදිලි සීරීමක්
* වම් කකුලේ Maleolus වලට 1.5 cm ඉහළින් 1.5 cm තරම් දිගින් වූ ඉරීමක්

එම තුවාල බරපතල නොවන මොට ආයුධයකින් සිදු වූ තුවාල ලෙස දක්වා ඇත.

Nature of Injury

01. Superfical abration 1cmx0.5cm in size left side of the head just abve the left ear lobe.
02. Grace abration 2cm x 3cm size over the medical aspect of the left leg 6.5cm above the medical maleolus.
03. Laceration 1.5cm in length over the lateral aspect of the left leg. 1.5 cm above the lateral maleolus.

## 19. ජේ.ඒ.ඩිල්ෂාන් සමීර ජයකොඩි යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:

දිවිමේදි වෙඩි වැදිමක් සිදු වූ බව

අධිකරණ වෛද්‍යවාර්තාවට අදාළ තුවාල :

* දකුණු උරහිස් ප්‍රදේශයේ ඇතුලු වූ තුවාලය 1.5cm × 1.5 cm තරම් තුවාලයක් (ඇතුලුව)
* පිටවූ තුවාලය 2.5 cm × 2.5 cm ප්‍රමාණයක වූ දකුණු තනපුඩ 4 cm ක් ඉහලින් පසුපස තුවාලයක්

එසේම 01 හා 02 තුවාල ගිනි අවියකින් සිදුවූ බරපතල තුවාල ලෙස දක්වා ඇත.

Nature of Injury

01. Entry wound – 1 ½ x 1 ½ cm size after the right shoulder region Exit wound – 2 ½ x 2 ½ cm size in front of the chest 2cm from middle 4 cm above the right nipple.

## 20. ඊ.එම්.ප්‍රසන්න විජේසිංහ යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:

හමුදා නිලධාරීන් එක් පොලිස් නිලධාරියකු හා සිවිල් වැසියෙකු විසින් පොලු තුවක්කු බදෙන් මුහුණට ඉහල limbs හා පහල limbs වලට හා පිටුපස පහර දෙන ලදි.

* අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව දක්වා ඇති තුවාල
* මුහුණ මැද එනම් නාස් පොල්ලේ 1cm ඉහලින් 1.5cm × 0.5 cm තරම් ගැඹුරු සිරීමක්
* නාසයේ සිට 3.5cm දුරින් වම් ඇසට පහලින් 1cm තරම් ප්‍රමාණයක වූ ඉරීමක්
* වම් ඇසේ ලේ තැල්මක්
* පහල තොල පටේ මැද සිට 0.5cm වම් පසට වන්නට 3cm ක ප්‍රමාණ වූ ඉරීමක්
* දකුණු වැලිවිට හන්දියෙන් 2.5cm ඉහලින් 3cm × 1.5 cm ගැඹුරු සිරීමක්
* වම් වැලිමිට සන්ධියේ 3.5cm × 2.5 cm තරම් වූ ගැඹුරු සිරීමක්

මෙම 1-6 දක්වා වූ තුවාල මොට ආයුධයකින් සිදුකල තුවාල ලෙස දක්වා ඇත.

Nature of Injury Grace abration 1.5cm x 0.5cm in size middle of the face 1cm above the nasal bridge. Laceration 1cm in size below the left eye 3.5cm from nose.

1. Subconjucival haemarrage – left eye. Laceration (sutured) 3cm in size over lower lip 0.5cm from midline towards left. Grace abration 3cm x 1.5cm in size lateral aspect of the left arm 2.5cm above elbow joint Grace abration 3.5cm x 2.5cm in size lateral aspect of the left side of the elbow.

## 21. එච්.ජේ.චින්තක පෙරේරා යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව:

අධිකරණ වෛද්‍යවරයාට ලබාදී ඇති රෝගී ඉතිහාසය :

හමුදා නිලධාරියෙකු විසින් වෙඩි තබා ඇති බව

වෛද්‍ය වාර්තාවට අනුව දක්වා ඇති තුවාල :

01. ඉදිරි මධ්‍ය රේඛාවේ සිට 4 cm ක් දුරින් හා තනපුඩුවේ සිට 6 cm පහලින් වම් ඉදිරි පපුවේ 0.5cm × 10 cm තරම් වු මතුපිට ඉරීමක්
02. තුවාලය ගිනි අවියකින් සිදුවී ඇති බව දක්වා ඇත.

Nature of Injury

1. A superficial laceration measuring 0.5cm x 10 placed transversely front aspect of left chest, 6cm below the nipple ad 4 cm from midline Injury pattern is consistent with a discharge of a fire arm and running parallel to the body surface, Just brushing the body.

## 22. ඩබ්.එම්. දිනේෂ් කුමාර අපොන්සු යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව :

හමුදා නිලධාරීන් පස් දෙනෙකු විසින් ලී පොලු වලින් පහරදුන් බව.

තුවාල නොමැති බව දක්වා ඇත.

## 23. ආර්.ඩී.සුමිත් චන්ද්‍රසේකර යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව :

අධිකරණ වෛද්‍ය වාර්තාවට ලබාදී ඇති රෝගී ඉතිහාසය :

හමුදා නිලධාරියෙකු විසින් වෙඩි තැබීම.

තුවාල වල ස්වභාවය :

01. දකුණු උඩු තොලේ පිටපත 1.3 cm ක් තරම් වු ඉරීමක්
02. දකුණු යටි ඇන්දේ 3 වන දතේ භග්නයක්
03. වැලමිට සිට 14 cm ඉහලින් වම් ඉහළ බාහුවේ පිටත 1 cm ඇතුලට කිඳා බැසුනු තුවාලයක්
04. වැලමිට සිට 16 cm ක් ඉහලින් වම් ඉහල බාහුවේ ඇතුලත 3 cm x 2 cm වු ඉරීමක්
05. වැලමිට සිට 4 cm ඉහලින් වම් ඉහල බාහුවේ 2 cm x 1 cm වු ඉරීමක්

- 2 හි දක්වා ඇති තුවාලය වෙඩි උණ්ඩය ඇතුලු වු ස්ථානයත් 4 වන තුවාලය වෙඩි උණ්ඩය පිටවු තුවාලයත් බව දක්වා ඇත.
- තුවාල අංක 02 බරපතල තුවාලයක් බව දක්වා ඇති අතර, 1, 2, 5 තුවාලයන් මොට ආයුධයකින් සිදුකළ තුවාල බවත් 3, 4 තුවාල ගිනි අවියකින් සිදුවු තුවාල බවත් දක්වා ඇත.

Injury No : 3 is an entry wound of a fire arm and injury No : 4 is the exit wound of same.

## උද්ඝෝෂණය විදුරුවා හැරීමේදී තුවාල ලැබූ යුද හමුදා සහ පොලිස් නිලධාරීන්ගේ

## අධිකරණ වෛද්‍ය වාර්තා

**01. කොප්‍රල් 321091 එස්.එස්.සමන් කුමාර - දෙල්ගොඩ කඳවුර**

රෝග ඉතිහාසය :- 2013.08.01 දින ප.ව 6.30 ට පමණ වැලිවේරිය නගරයේදී නොදන්නා මිනිසුන් පිරිසක් විසින් ගල් කැබැල්ලකින් නලලට පහරදුන් බව දක්වයි.

තුවාල :- 01. නාස් පොල්ල 4 cm ක් ඉහලින් නලලේ වම් පස 2.5 cm පමණ ඉරිමක්

තුවාල සිදුවී ඇති ආකාරය :- මොට ආයුධයකින්

Sceutured laceration over the left side of the fore-head 2.5 c.m. in size 4 c.m above the nasal bridge starting from midline towards left.

**02. කොප්‍රල් 10465 එම්.ඒ.අජිත් සුහසිංහ - දෙල්ගොඩ කඳවුර**

රෝග ඉතිහාසය :- 2013.08.01 දින ප.ව 6.30 ට වැලිවේරිය නගරයේදී පිරිසක් විසින් ගල් වලින් වම් ඉහල Limb හා දකුණ පහල Limb වෙත පහරදුන් බවයි.

තුවාල :- 01. වම් මැණික් කටුව ඉහල 4 x 3 cm වූ තද සිරීමක් දකුණු දණහිස් සංදියේ

02. 1 x 2 cm තද සිරීමක්

තුවාල සිදුවී ඇති ආකාරය :- 01, 02 තුවාල මොට ආයුධයකින් සිදුවූ තුවාල බව දක්වා ඇත.

01. Grace Abration 4 x 3 c.m. in size over the posterior aspect of the left wrist.
02. Grace Abration 1x2 c.m. in size over the medical aspect of the right knee joint.

**පුවත්පත් වාර්තා ශිර්ෂපාඨ :-**

මෙම සිද්ධිය සම්බන්ධයෙන් පුවත්පත් වල වාර්තා පළ වු අතර, එම පුවත්පත් වාර්තා වල ශීර්ෂපාඨ වලින් කිහිපයක් පහත පරිදි වේ.

| දිනය | පුවත්පත | | ශිර්ෂපාඨය |
|---|---|---|---|
| ➢ 2013.08.04 | ඉරිදා ලංකාදිප | - | "පලයෙන් උපන් රතුපස්වල ගින්න"<br>"හමුදාව සහ උද්ඝෝෂකයන් අතර ගැටුම්" |
| ➢ 2013.08.09 | ලංකාදිප | - | "රතුපස්වල මරණ ඃ ඕනෑම කෙනෙකුට සාක්ෂි දිය හැකියි"<br>"ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු මාධ්‍යයට කළ ප්‍රකාශය පිළිබඳ පරීක්ෂණයක් ඕනෑ" |
| ➢ 2013.08.02 | ලංකාදිප | - | " බැලුම්මහර උද්ඝෝෂණයට යුද හමුදාවෙන් ප්‍රහාරයක් " |
| ➢ 2013.08.03 | ලංකාදිප | - | "සාමකාමී උද්ඝෝෂණවලට ප්‍රහාර එල්ල නොකළ යුතුයි වැලිවේරිය සිද්ධිය ගැන ඇමරිකානු තානාපති කර්යාලය කියයි" |
| ➢ 2013.08.03 | ලංකාදිප | - | "රතුපස්වල සිද්ධියේ මාධ්‍යවේදීන්ට පහර දීමේ වගකීම අපට භාරගන්න බැහැ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂක ආරියරත්න ඇතුගල කියයි" |
| ➢ 2013.07.27 | ලංකාදිප | - | "රතුපස්වල ගම්මාන පහක ලිංවතුරේ ඇසිඩ් ගතිය වැඩිවෙලා, බිව්වොත් ලෙඩ බොන්න නාන්න වතුර නැතිව ගම්වාසීන් අසීරුතාවක" |
| ➢ 2013.07.29 | ලංකාදිප | - | "කම්හලක අපද්‍රව්‍ය වලින් ලිංවතුරේ ඇසිඩ්, වැලිවේරියේ ගම් 12 ක පිරිස් උද්ඝෝෂණයේ" |
| ➢ 2013.08.01 | ලංකාදිප | - | "රතුපස්වල උද්ඝෝෂණ හතරවැනි දිනටත් කම්හල වසා විසදුමක් විසදුමක් දෙනතුරු උද්ඝෝෂණය නවත්වන්නේ නැහැ ප්‍රදේවාසීහු කියති" |

- 2013.08.02 ලංකාදිප - "බැලුම්මහර උද්ඝෝෂණයට යුද හමුදාවෙන් ප්‍රහාර හමුදාවට පෙට්‍රල් බෝතල්වලින් ගහලා මරණ එකයි 23 කට තුවාල හමුදාවේ 05 කටත් තුවාල"

- 2013.08.03 ලංකාදිප - "තරුණයාගේ මරණයට රජය - හමුදාව වගකිව යුතුයි, බිමට වතුර ඉල්ලූ ජනතාවට උත්තර දුන්නේ උණ්ඩයෙන් රතුපස්වල ප්‍රශ්නයට විසඳුම් සෙවූ හැටි හරිද?"

- 2013.08.03 ලංකාදිප - "රතුපස්වල හා අවට ගම්වල ජල දූෂණ පරීක්ෂණ අරඹයි, කම්හලේ සහ ප්‍රදේශයේ ලිංවල ජල සාම්පල එකතුකරයි."

- 2013.08.03 ලංකාදිප - "රතු පස්වල සිද්ධිය : ආරක්ෂක ලේකම් - පොලිස්පති ඇතුලු රාජ්‍ය ආයතන 25 ක ප්‍රධානීහු මානව හිමිකම් කොමිසමට"

- 2013.08.03 ලංකාදිප - "උගන්ඩාවට වතුර දෙන්න කෝටි ගණන් වැය කරන ආණ්ඩුව වතුර ඉල්ලන රතුපස්වල ජනතාවට වෙඩි තබා මර්ධනය කරනවා"

- 2013.08.03 ලංකාදිප - "වෙඩිවරුසා මැද්දේ අපි දෙන්නා දිව්වා පුතා කොහේ ගියාද හොයාගන්න බැරි උනා වෙඩි වැදී මියගිය තරුණයාගේ මව කියයි."

- 2013.08.04 ලංකාදිප - "ගම් දහයක ජනතාවට ඇසිඩ් වතුර මදිවාට, වෙඩි උණ්ඩවලින්නුත් සංග්‍රහයක්, තවමත් ප්‍රශ්නයට විසඳුමක් නැහැ"

- 2013.08.04 The Sunday Times - " woes of weliweriya water war"

- 2013.08.05 ලංකාදිප - "වැලිවේරිය ගැටුමේදී තුවාල ලැබූ 11 ක් තවමත් ගම්පහ රෝහලේ, ඒ අතර වෙඩි වැදුනු සිසුහු හතරක්"

- 2013.08.06 ලංකාදිප - "වැලිවේරිය මරණ : ෂමිල මියගියේ වෙඩි පහරින් නිලන්ත මියගියේ මොට ආයුධ ප්‍රහාරයකින්, පශ්චාත් මරණ පරීක්ෂණවලදී නිගමනය වේ."

- 2013.08.11 ලංකාදීප - "මිඩියාවල ඉන්නේ බල්ලෝ මුන් තමයි ප්‍රශ්න අවුල් කරන්නේ"

- 2013.08.23 ලංකාදීප - "පාරෙන් අයින්වෙන්න විනාඩි දහයක් දෙන්නැයි ඉල්ලුවාම දැන්ම අයින්වෙයම් : මුන්ට ගහපියව් කියා බ්‍රිගේඩියර් කිවා, මහේස්ත්‍රාත් පරීක්ෂණයේදි නැදුන්ගමුවේ පුඩි කියයි."

**වගඋත්තරකරුවන් ලෙස පොලිස් නිලධාරීන්ගෙන් ලබාගන්නා ලද ප්‍රකාශ :-**

2013.08.01 දින උද්ඝෝෂණය විසිරුවා හැරීමට කටයුතු කර ඇති පොලිස් නිලධාරීන් ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක, නියෝජ්‍ය පොලිස්පති ලියනගමගේ කුලරත්න, පොලිස් අධිකාරී විපිත දයානන්ද කොමසාරු, පොලිස් අධිකාරී එම්.ඒ.ඒ.රංජිත් මාසිංහ, සහකාර පොලිස් අධිකාරී පයලත් බලගල්ල, ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන් වන එස්.කේ.උපාලි, කේ.ඥානරත්න, මගලෙගොඩ සහ පොලිස් පරීක්‍ෂකවරුන් වන ප්‍රදිප් නිශාන් උඩවත්ත, ඒ.එම්.පී.ඩබ්.අලහකොන්, සංජීව සම්පත් යන අයගෙන්ද උප පොලිස් පරීක්‍ෂක තුෂාර චතුරංග යන නිලධාරීන් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවට කැඳවා ප්‍රකාශ සටහන් කර ගෙන ඇත.

මොවුන්ගේ ප්‍රකාශ අනුව උද්ඝෝෂණය විසිරුවා හැරීමේදි කිසිදු පුද්ගලයෙකුට වෙඩි තැබීමක් හෝ පහරදිමක් පොලිස් නිලධාරීන් විසින් සිදු කර නොමැති බව ප්‍රකාශ කර ඇත. එමෙන්ම යුද්ධ හමුදාව විසින් මෙම උද්ඝෝෂණය විසිරුවා හැරීමේදි ප්‍රධාන කාර්ය භාරයන් ඉටුකර ඇති බව ඔවුන්ගේ ප්‍රකාශ අනුව පැහැදිලි වේ.

නමුත් උද්ඝෝෂණය විසිරුවා හැරීම සඳහා යුද්ධ හමුදාව කැඳවන ලද්දේ කවුරුන් විසින් ද යන්න පිළිබඳව විමසීමේදි වගඋත්තරකාර පොලිස් නිලධාරීන් ලබාදි ඇති ප්‍රකාශ පරස්පර විරෝධි බව දක්නට ලැබේ.

**වගඋත්තරකරුවන් ලෙස හමුදා නිලධාරීන්ගෙන් ලබා ගන්නා ලද ප්‍රකාශ :-**

බලසේනාපති (142) බ්‍රිගේඩියර් දේශප්‍රිය ගුණවර්ධන ඇතුළුව හමුදා නිලධාරීන් හා සෙබලුන් විසිදෙදෙනෙකු (22) මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කැඳවා දිර්ඝ ලෙස ප්‍රශ්න කර ප්‍රකාශ සටහන් කර ගන්නා ලදි. ඔවුන්ගේ ප්‍රකාශ අනුව මෙම උද්ඝෝෂණය විසිරුවා හැරීමට ඔවුන් සියල්ල සහභාගී වූ බව පිළිගෙන ඇත. ප්‍රකාශ ලබා ගන්නා ලද නිලධාරීන් හා සෙබලුන් පහත පරිදි වේ.

01. බ්‍රිගේඩියර් එස්.ඩී.ඒ.දේශප්‍රිය ගුණවර්ධන , බලසේනාධිපති (142) - ගම්පහ, කළුතර හා කොළඹ නගරසීමාව.
02. ලුතිනන් කර්නල් ඒ.එස්,ප්‍රසාද් සිල්වා , කමාන්ඩෝර් රෙජිමේන්තු කඳවුර, ගණේමුල්ල.
03. ලුතිනන් කර්නල් ඩබ්.බී.ජේ.කේ.විමලරත්න , යුද හමුදා කඳවුර, වැලිසර.

04. කපිතාන් ඇලෙක්සැන්ඩර්, යුද හමුදා කඳවුර, දෙල්ගොඩ.

05. ලුතිතන් කර්නල් යූ.අනුරුද්ධ සෝලංගආරච්චි, යුද හමුදා කඳවුර, දෙල්ගොඩ.

06. ලුතිතන් ඒ.ඩී.මධුෂාන් අත්තනායක , යුද හමුදා කඳවුර, දෙල්ගොඩ.

07. මේජර් ව්.ඩී.ඩී.ආර්.විරපුර , යුද හමුදා කඳවුර, දෙල්ගොඩ.

08. කපිතාන් මලින්ද පිරිස් , යුද හමුදා කඳවුර, දෙමටගොඩ. (යුනිකොන් රථ)

09. මේජර් මහින්ද කුමාර දිසානායක , යුද හමුදා කඳවුර, මරදාන.(ධාවන යතුරු පැදි)

10. පියල් චන්දන, සෙබල 401294, 5 වන ගැ.හේ.බ.ඇ යුද හමුදා කඳවුර, දෙමටගොඩ.

11. කේ.ඒ.අජිත් සුභසිංහ ,කෝප්‍රල් 15465,යුද හමුදා කඳවුර, වැලිසර.

12. ඩී.පාලිත දිසානායක ,කෝප්‍රල් 00272, යුද හමුදා කඳවුර, දෙල්ගොඩ.

13. එච්.පී.ඩී.දිසානායක, කෝප්‍රල් 400858, යුද හමුදා කඳවුර, වැලිසර.

14. එස්.වී.එස්.සමන්කුමාර, කෝප්‍රල් 321091, යුද හමුදා කඳවුර,දෙල්ගොඩ.

15. ආර්.ඒ.විරසුරිය , කෝප්‍රල් 402342, යුද හමුදා කඳවුර,වැලිසර.

16. කේ.පී.ඒ.අයි.දිසානායක , කෝප්‍රල් 162604 - තුවක්කු සෙබල, හමුදා කඳවුර, වැලිසර

17. එල්.අර්.එස්.පී.ශ්‍රේ , කෝප්‍රල්, යුද හමුදා කඳවුර, දෙල්ගොඩ.

18. එච්.කේ.ඩී.එස්.සෙනවිරත්න , ලාන්ස් කෝප්‍රල් 15465, යුද හමුදා කඳවුර,මරදාන.

19. කේ.එච්.දිනුෂ එරංග , සෙබල, යුද හමුදා කඳවුර, දෙල්ගොඩ.

20. ඩී.එම්.එස්.බී.රත්නායක ,කෝප්‍රල්,යුද හමුදා කඳවුර, දෙල්ගොඩ.

21. ඩී.යූ.චන්ද්‍රසේකර ,319296 කෝප්‍රල්, යුද හමුදා කඳවුර, දෙල්ගොඩ.

22. ලුතිනන් පී.වී.ඒ.නිරෝෂ් ,බුද්ධි නිලධාරි, යුද හමුදා කඳවුර, දෙල්ගොඩ.

ඉහත හමුදා නිලධාරින්ගේ ප්‍රකාශ අනුව වැලිවේරිය වෙනීන්ග්‍රෝස් කර්මාන්ත ශාලාව අසල 2013.07.27 වන දින සිට එහි ආරක්‍ෂාවට හමුදා නිලධාරින් යොදවා සිටි බවත් 2013.08.01 දින බැලුම්මහර හා වැලිවේරිය උද්ඝෝෂණ පැවති අවස්ථාවේ ආරක්‍ෂක ලේකම්තුමා සමග පැවති සාකච්ජාවේ ප්‍රතිඵල දැනුම්දිමට බ්‍රිගේඩියර්වරයා ඇතුලු හමුදා නිලධාරින් එහි ගිය අවස්ථාවේ උද්ඝෝෂකයන් විසින් හූ කියා ගල් මුල් ප්‍රහාර එල්ල කිරිමත් සමග ගැටුම්කාරි තත්ත්වය ඇතිවූ බවට ප්‍රකාශ කර ඇත.

බල සේනාපති හෝ ඉහළ නිලධාරින් විසින් වෙඩි තැබීමට නියෝග ලබා දි නොමැති බවත් හමුදා සෙබලුන් විසින් ආත්මාරක්‍ෂාවේ අයිතිය සහ ඉහළ නිලධාරින්ගේ පිවිතාරක්ෂාව සඳහා ද දේපල ආරක්ෂාවටද අහසට වෙඩි තැබීම් සිදු කර ඇති බව ප්‍රකාශ කර ඇත. උද්ඝෝෂකයන්ට පහරදීම් කිරිම පිළිබඳ චෝදනා සහ උද්ඝෝෂකයන්ට වෙඩි තැබීම් පිළිබඳ චෝදනා ප්‍රතික්‍ෂේප කර ඇත.

<u>අදාළ වන නෛතික තත්ත්වයන් සහ අවධානය යොමු කළ නෛතික ලේඛන :-</u>

01 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

02. අපරාධ නඩුවිධාන සංග්‍රහය

03. පොලිස් ආඥා පනත

04. පොලිස් නියෝග

05. මහජන ආරක්ෂක ආඥා පනත

06. යුද්ධ හමුදා පනත

07. 2013.07.03 හා අංක : 1817/31 දරණ ගැසට් නිවේදනය

රතුපස්වල වැලිවේරිය ප්‍රදේශයේ ජල ගැටලුවට විසඳුම් ලබාදෙන ලෙස ඉල්ලා පැවති උද්ඝෝෂණය විසුරුවා හැරීමේදී වගඋත්තරකරුවන් විසින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1), 12 (2), 11 සහ 14, 13, 10 යන වගන්ති උල්ලංඝනය කරමින් එම ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර තිබේද යන්න පිළිබඳ මානව හිමිකම් කොමිෂන් සභා විමර්ශන නිලධාරී කණ්ඩායම අවධානය යොමු කර ඇත.

වගඋත්තරකරුවන්ට තම රාජකාරි ඉටුකිරීමේදී ඉහත සඳහන් ලේඛන වලින් නෛතික ප්‍රතිපාදන සැලසුනද ඔවුන්ගේ රාජකාරි සීමාව තුළ බලය අයුතු ලෙස යෙදවීම හෝ බලය අභිබවා කටයුතු කිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදුකළ නොහැක.

**නිරීක්ෂණ :-**

2013.08.01 දින වැලිවේරිය හා බැලුම්මහර ප්‍රදේශවල පැවැති උද්ඝෝෂණය විසුරුවා හැරීමේදී ඇතිවූ ගැටලුව සම්බන්ධව සිවිල් වැසියන් මාධ්‍යවේදි හමුදා නිලධාරින් හා පොලිස් නිලධාරින් යන විවිධ පාර්ශවයන් විසින් ප්‍රකාශ ලබාදි ඇත. ජනතා උද්ඝෝෂණයට පදනම් වු වෙනින්ග්‍රොස් පුද්ගලික ආයතනය රබර් අත්වැසුම් නිෂ්පාදන කරන කර්මාන්ත ශාලාවක් වන අතර, එම කර්මාන්ත ශාලාව විසින් බැහැර කරන ඝණ අප ද්‍රව්‍ය සහ අපවිත්‍ර ජලය හේතුකොටගෙන ප්‍රදේශයේ භූගත ජලය අපවිත්‍රව ඇති බවත් එම ජලයේ පී.එච් අගය PH 3 දක්වා පහත වැටි ඇති බවට ඉදිරිපත් වී ඇති මතය අනුව එම කර්මාන්ත ශාලාව වසා දැමිය යුතු බවට 2013.07.27 වන දින සිට 2013.07.31 දින දක්වා කර්මාන්ත ශාලාව අවට ප්‍රදේශයේ මහජනතාව 3000-4000 ක් පමණ පිරිසක් උද්ඝෝෂණය පවත්වා ඇත. 2013.08.01 දින මෙම උද්ඝෝෂණයට සහාය දැක්වීමට බැලුම්මහර හන්දිය සහ වැලිවේරිය නගරය යන ස්ථානවල ජනතාව 5000 කට අධික පිරිසක් රැස්වී උද්ඝෝෂණය පවත්වා ඇති බව නිරීක්ෂණය වේ.

ප්‍රදේශයේ ලිංවල ජලයේ පී.එච් අගය අඩුවී ඇති බවට ප්‍රදේශයේ ජනතාව කරන ප්‍රකාශ සත්‍ය බව එම ලිං ජලය පිළිබඳ පරීක්ෂණ පැවැත්වු රාජ්‍ය ආයතන වලින් ලබාදි ඇති වාර්තා අනුව නිරීක්ෂණය වේ.

එම ප්‍රදේශයේ ජලයේ පී.එච් අගය අඩුවීමට මෙම කර්මාන්ත ශාලාවෙන් බැහැර කරන අපවිත්‍ර ජලය සහ ඝණ අප ද්‍රව්‍ය වල බලපෑමක් සිදුවී ඇද්ද යන්න තවදුරටත් තහවුරු කර ගත යුතු කාරණයක් බවද නිරීක්ෂණය වේ.

2013.07.27 දින සිට 2013.07.31 දින දක්වා රතුපස්වල වෙනින්ග්‍රොස් කර්මාන්ත ශාලාව සහ රතුපස්වල ක්‍රිඩා භූමිය අසල සාමකාමි උද්ඝෝෂණයක් පවත්වා ඇතත් ඒවා විසුරුවා හැරීමට පොලිස් නිලධාරින් හෝ යුද්ධ හමුදාව බලය අයුතු ලෙස යොදවා ඇති බවට පැමිණිලි හෝ තොරතුරු වාර්තා වී නොමැති අතර,

2013.08.01 දින ද රතුපස්වල වෙනින්ග්‍රොස් කර්මාන්ත ශාලාව අසල පැවැති උද්ඝෝෂණය විසිරුවා හැරීමට පොලිස් නිලධාරීන් හෝ යුද්ධ හමුදා නිලධාරීන් බලය අයුතු ලෙස යෙදවීමක් සිදුකර ඇති බවට පැමිණිලි හා තොරතුරු වාර්තා වී නොමැත.

මීට අමතරව 2013.08.01 දින ද වැලිවේරිය නගරයේ පැවැති උද්ඝෝෂණය සහ බැලුම්මහර මංසන්දියේදි පැවැති උද්ඝෝෂණ විසුරුවා හැරීමට පොලිසිය සහ යුද හමුදාව කටයුතු කර ඇති බව සියලු පාර්ශවයන් විසින් ලබාදි ඇති ප්‍රකාශ සහ වාර්තා අනුව  නිරීක්ෂණය වේ.

එම උද්ඝෝෂණ දෙක විසිරුවා හැරීමේදි එහි සිටි පුද්ගලයින්ට වෙඩි තැබීම හා පහරදීම් සිදුකරන ලද්දේ යුද්ධ හමුදා නිලධාරීන් හා සමාන ඇඳුම් ඇඳසිටි පිරිස් බවට එම සිද්ධිය වු ස්ථානවල සිටි පුද්ගලයින් සහ මාධ්‍යවේදින් ලබාදෙන ලද ප්‍රකාශ අනුව පැහැදිලි වේ.

මෙම උද්ඝෝෂණය පැවැති 2013.08.01 දින කොළඹදි ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ප්‍රදේශයේ ප්‍රභූන්, වෙනින්ග්‍රොස් කර්මාන්ත ශාලාවේ නියෝජිතයන් ආගමික ප්‍රධානින් සහ උද්ඝෝෂනයේ යෙදි සිටි පිරිසේ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් රැස්වීමක් පවත්වා ඇති අතර, ගන්නා ලද තිරණ පිළිබඳව දැනුම්දීම සඳහා යුද්ධ හමුදා බල සේනාධිපති බ්‍රිගේඩියර් දේශප්‍රිය ගුණවර්ධන ඇතුලු යුද්ධ හමුදා නිලධාරීන් කණ්ඩායමක් වැලිවේරිය නගරයේ උද්ඝෝෂණය පවත්වමින් සිටි උද්ඝෝෂකයන් අතරට ගොස් මෙගා ෆොන් එකක් ආධාරයෙන් කථා කොට දැනුම්දීමක් සිදුකොට ඇති බව ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව සනාතවේ. එහිදි ලබාදි ඇති තීරණය වන්නේ කර්මාන්ත ශාලාව තාවකාලිකව වසා දැමීමට හා ජල ගැටලුව සම්බන්ධයෙන් කඩිනම් විසඳුම් ලබාදිමටයි.

මෙම අවස්ථාවේදි උද්ඝෝෂකයින් සහ බ්‍රිගේඩියර් දේශප්‍රිය ගුණවර්ධන අතර, වචන හුවමාරුවක් සිදු ඇති බව ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව  තහවුරු වේ.

උද්ඝෝෂණයේ යෙදි සිටි පිරිස අතරින් කොටසක් හමුදා නිලධාරීන්ට හූ කියමින් ඝෝෂා පවත්වා ඇති අතර, දෙපාර්ශවය අතර උණුසුම් තත්ත්වයක් ඇති වී උද්ඝෝෂකයින් විසින් යුද්ධ හමුදා නිලධාරීන්ට ගල් මුල් ප්‍රහාර එල්ලකර ඇති බව සාක්ෂි ලබාදි ඇති හමුදා සහ පොලිස් නිලධාරීන් ප්‍රකාශ කර ඇත.

ඒ සමගම උද්ඝෝෂකයින් දෙසින් වෙඩි ශබ්ද ඇසුනු බව වගඋත්තරකාර හමුදා සහ පොලිස් නිලධාරීන් ප්‍රකාශ කර ඇත.

යුද්ධ හමුදා සෙබලුන් වන සෙ 316586 කෝප්‍රල් ශ්‍රේ,  සෙ 162604 තුවක්කු සෙබල දිසානායක කේ.පී.එල්, සෙ 402342 කෝප්‍රල් විජේසූරිය ආර්.ඒ,  සෙ 321086  කෝප්‍රල් රත්නායක  ඩී.එන්.බී,  සෙ 319265 එරංග කේ.එච්.ඩී,  ලා.කෝ  302211 සෙනෙවිරත්න යන අය විසින් ඔවුන් ට නිකුත් කර තිබු ටී 56 වර්ගයේ ගිනි අවිවලින්  අහසට වෙඩි තැබූ බව ඔවුන් විසින් කොමිෂන් සභාවට ලබාදි ඇති  ප්‍රකාශ වල සඳහන් කර ඇත. නමුත් සෙබල 319296 කෝප්‍රල් උදය කුමාර චන්ද්‍රසේකර යන අයගේ ගිනි අවියෙන් උන්ඩ 03 හෝ 04 ක් පිටවු බව සඳහන් කර ඇතත් ඔහු අහසට හෝ උඩට වෙඩි තැබූ බවක් සඳහන් කොට නොමැත.

එසේ වෙඩි තබන ලද්දේ කාගේ නියෝග මතද යන ප්‍රශ්නයට පිළිතුරු දෙමින් ඔවුන් ප්‍රකාශ කර ඇත්තේ වෙඩි තැබීමට කිසිවෙකුගෙන් වත් නියෝග නොලැබුනු බවත් උද්ඝෝෂකයින් විසින් ගල් මුල්, කඩු, යකඩ පොලු, පෙට්‍රල් බෝම්බ, වැලි පිරවූ විදුරු බෝතල් අතැතිව හමුදා නිලධාරීන්ට ප්‍රහාර එල්ල කිරීමට උත්සහ කරන විට නිලධාරීන්ගේ ආරක්ෂාවටත් තමන්ගේ ආරක්ෂාවටත් රජයේ දේපල වල ආරක්ෂාවටත් එසේ අහසට වෙඩි තැබූ බවයි.

හමුදා නිලධාරීන් හා සෙබලුන් විසින් අහසට වෙඩි තැබූ බව ප්‍රකාශ කලද වෙඩි වැදීම නිසා පුද්ගලයින් 03 දෙනෙකු මිය ගොස් ඇති අතර, පුද්ගලයින් 36 දෙනෙකු තුවාල ලබා රෝහල් ගත වී ඇති බවට කරුණු වාර්ථා වී ඇත. ඒ බව සාක්ෂි කරුවන්ගේ ප්‍රකාශ වලින් සහ අධිකරණ වෛද්‍ය වාර්තා සහ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා අනුව තහවුරුවේ.

එම තුවාල ලැබූ පිරිස අතර උද්ඝෝෂණයට සහභාගී නොවූ රාජකාරි සඳහා ගොස් නැවත නිවෙස් බලා යන අයද පාසල් හා උපකාරක පන්ති සඳහා ගොස් නැවත එමින් සිටි පිරිස් ද වන බව සාක්ෂි අනුව පැහැදිලිවේ.

මෙම සිද්ධියේ දී මියගිය එච්.එස්. රවිශාන් පෙරේරා සහ එච්.ඒ.ඩී. අකිල දිනේෂ් යන අය වෙඩි ප්‍රහාර වලින් මිය ගොස් ඇති අතර පී.ආර්.පී. නිලන්ත පුෂ්පකුමාරගේ හිසට මොට ආයුධයකින් පහර දීම නිසා මියගොස් ඇති බව පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා අනුව පැහැදිලි වේ. මීට අමතරව මොවුන්ගේ සිරුරුවල තැලීම් සීරීම් තුවාල හඳුනාගෙන ඇත.

මෙම සිද්ධියේ දී තුවාල ලබා ඇති සිවිල් වැසියන් 22 දෙනෙකුගේ වෛද්‍ය වාර්තා ලැබී ඇත. ඔවුන් අතර වෙඩි වැදීම් වලට ලක්වී තුවාල ලැබූ අය මෙන්ම පහරදීම් නිසා තුවාල ලැබූ අයද සිටී. බරපතල තුවාල සහිත අස්ථි බිඳීම් වලට ලක්වූවන් මෙන්ම දත් අහිමිවූවන් පහරදීම් නිසා ඇස් වලට හානි වූ පුද්ගලයින් ද මොවුන් අතර සිටින බව සිවිල් වැසියන්ගේ ප්‍රකාශ වලින් අනාවරණය වූ අතර, අධිකරණ වෛද්‍ය වාර්තාවලින් ඒ බව තහවුරුවේ.

නි 68614 ලුතිතන් නිරෝෂ් පී.බී.ඒ. යන අය 2013.07.28 වන දින සිට 2013.08.01 දින දක්වා බුද්ධි නිලධාරියෙකු ලෙස උද්ඝෝෂකයින් අතර රැඳී සිටිමින් නිරීක්ෂණයන් සිදුකරමින් ඉහළ නිලධාරීන් දැනුවත් කර ඇත. ඔහුගේ ප්‍රකාශයේ සඳහන්ව ඇත්තේ 2013.08.01 දින වැලිවේරිය නගරයේ උද්ඝෝෂකයින් අතර තමා ද පොල්ලක් සහ ගඩොල් කැටයක් අතැතිව සිටි බවයි.

එහිදී උද්ඝෝෂකයින් අත වැලි පිරවූ විදුරු බෝතල්, පොලු, කඩු තිබෙනු දුටුවද උද්ඝෝෂකයින් අතේ ගිනිඅවි තිබෙනු නොදුටුව බවයි.

ගැටුම්කාරී අවස්ථාවේ පෙට්‍රල් බෝම්බ හමුදාව දෙසට විසිකරනවා තමා දුටු බව ප්‍රකාශකර ඇත. තවද මොහු ප්‍රකාශ කර ඇත්තේ එහි සිටි උද්ඝෝෂකයින්ට විසිරයාමට විනාඩි 10ක් ලබාදුන් බවත් ඉන් පසු විනාඩි 30ක් ඉල්ලු බවත් ඉන්පසු එහි සිටි පිරිස එහි තබා තිබූ මිනීපෙට්ටිය සහ මල්වඩම් ඉවත්කර පාරේ අටවා තිබූ ටකරන් මඩුවත් ඉවත් කළ බවත් ඉදිරියෙන් සිටි පිරිස විසිර ගිය බවත් මොහු සඳහන් කරයි. පැය බාගයකට පසුව නැවත බ්‍රිගේඩියර් ගුණවර්ධන එම ස්ථානයට පැමිණෙන විට විසිර නොගිය පිරිසේ සිටි අයෙකු කුමක් හෝ පැවසූවිට බ්‍රිගේඩියර් ගුණවර්ධන මහතා ඇඟිල්ල දිගු කරගෙන කුමක්

හෝ පවසමින් ඒ දෙසට යනවිට රැස්ව සිටි උද්ඝෝෂකයින් දෙසින් ගල්මුල් ප්‍රහාර එල්ලවූ බවත් එතැන් සිට ගැටුම ආරම්භ වූ බවත් ප්‍රකාශ කර ඇත.

පිරිස විසුරුවා හැරීම සඳහා කැරලි මර්ධන කන්ඩායම් සහ ජල ප්‍රහාරක රථ  කඳුලු වායු  විදින උපකරණ සහ කඳුලු වායු, උණ්ඩ කඳුලු වායු, බෝම්බ අවශ්‍ය ප්‍රමාණයට වැලිවේරිය පොලිස් ස්ථාන භූමිය අවට ස්ථාන ගත කර තිබූ බව වගඋත්තර කරුවන්ගේ ප්‍රකාශ අනුව පැහැදිලි වේ. නමුත් උද්ඝෝෂකයන් කලහකාරී ලෙස හැසිරෙන විට මුලින්ම සිදු කර ඇත්තේ වෙඩි තැබීම බවත් එනම් වෙඩි ශබ්ද ඇසීමෙන් පසු කඳුලු වායු සහ ජල ප්‍රහාර එල්ල කළ බව පැමිණිලිකරුවන් ප්‍රකාශ කර ඇත. එමෙන්ම පොලිස් හා හමුදා නිලධාරීන්ගේ ප්‍රකාශ වලින් ද ඒ බව සනාථවේ.

එමෙන්ම වැලිවේරිය නගරයේ සිටි උද්ඝෝෂකයින්  ක්‍රිස්තියානි දේවස්ථානයට ආරක්ෂාව පතා දිව යාමෙන් පසුවද හමුදා නිලධාරීන් දේවස්ථානයට ද ගොස් පහරදීම් සහ වෙඩි තැබීම් කර ඇති බව පැමිණිලිකරුවන් ප්‍රකාශ කර ඇත. වගඋත්තරකාර හමුදා  සහ පොලිස් නිලධාරීන්ගේ ප්‍රකාශ අනුව ද ඒ බව තහවුරුවේ. මාධ්‍යවේදීන් විසින් ලබාදී ඇති ප්‍රකාශ හා ඡායාරූප අනුවද දේවස්ථානය තුළ සිටි පිරිසට ප්‍රහාර එල්ලවී ඇති බව සනාථ වේ.

එමෙන්ම දේවස්ථානයේ කුස්සියේ විශාල පිරිසක් බොහෝ වේලාවක් ප්‍රහාර වලින් මිදීමට සැඟවී සිටි බවට පැමිණිලිකරුවන් සඳහන්කර ඇත. හමුදා නිලධාරීන් විසින් ලබාදී ඇති ප්‍රකාශ සලකා බැලීමේදීද ඒ බව සනාථ වී ඇත.

ටෙලිකොම් ආයතනයේ සේවයේ යෙදී සිටි සේවකයන් රාත්‍රි 7.00 වන විටත් කාර්යාලයේ රැඳී සිටි බවත් රාත්‍රි 7.00 ට පමණ ආයතනයේ වසා තිබූ ගේට්ටුව කඩා දමා කාර්යාල පරිශ්‍රයට ඇතුලු වී යුද්ධ හමුදා නිල ඇඳුමින් සිටි නිලධාරීන් 30 දෙනෙකු පමණ “උඹලා නිසා තමයි අපි ගුටිකන්නේ” යනුවෙන් ප්‍රකාශ කරමින් පොලුවලින් ඔවුනට පහරදුන් බවත් රාජකාරියේ යෙදී සිටින බව පවසමින් රාජකාරී හැඳුනුම්පත ඉදිරිපත් කළද එය කිසිවක් සැලකිල්ලට නොගෙන පහරදුන් බව කියා ඇත. ටෙලිකොම් ආයතනයේ සේවකයින් 05 දෙනෙකුට මෙලෙස පහරදී බිම ඇද වැටුනු විට පාගමින් තවත් පහරදුන් බව කියා සිටි. යුධ හමුදා නිලධාරීන් විසින් ලබා දුන් ප්‍රකාශ සලකා බැලීමේදී ඔවුන් ටෙලිකොම් ආයතනයට ගිය බව සනාථ වේ. නමුත් එහිදී පහර දීමක් සිදුකළාද යන්න පිළිබඳ ඔවුන්ගේ ප්‍රකාශ අනුව සනාථ නොවුවද ඉදිරිපත් වී ඇති බාහිර සාක්ෂි හා වෛද්‍ය වර්තා අනුව පහරදීම් සිදුකොට ඇති බව පැහැදිලි වේ.

වැලිවේරිය සහ බැලුම්මහර  2013.08.01 දින  පැවති උද්ඝෝෂණය ආවරණය කිරීම සඳහා ගොස් සිටි. මාධ්‍යවේදීන්ට පහරදී ඔවුන්ගේ කැමරා උපකරණවලට හානිකර ඇති බවත් පහත් ආකාරයෙන් ඔවුන්ට බැණවැදී ඇති බවත් මාධ්‍යවේදීන් ලබා දෙන ලද ප්‍රකාශවල වලද මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවල සඳහන් වේ.

මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දී ඇති **චානක ගිරාල් කුලසේකර** නැමති මාධ්‍යවේදියා ප්‍රකාශ කර ඇත්තේ බැලුම්මහර පැවති උද්ඝෝෂණය ආවරණය කිරීම සඳහා තමා ගොස් සිටියදී ඡායාරූප ලබා ගැනීමට ඒ අසල පිහිටි නිවසක උලු වහලක් මතට නැග ඡායාරූප ලබා ගත් බවත් තමා බිමට බසින විට යුද්ධ හමුදා නිලධාරීන් දැක නිලධාරීන් 40ක් පමණ වටකර ගෙන “මීඩියා

බල්ලෝ තොපි තමයි මේවා අවුස්සන්නේ" කියමින් තමාට පහර දෙමින් තමාගේ වටිනා කැමරාව පොළවේ ගසා කුඩු කළ බව කියා සිටී. තමාට පහරදීම නිසා ඇතිවූ තුවාලවලට ගම්පහ රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ගත් බවත් පසුව තමාගේ කුඩු කළ කැමරාව වෙනුවට ආර්ථික කටයුතු අමාත්‍යාංශයට කැඳවා බැසිල් රාජපක්ෂ මැතිතුමා නව කැමරාවක් ලබා දුන් බව සඳහන් කර ඇත. මේ ආකාරයට මාධ්‍යවේදීන් 06 දෙනෙකු පමණ කොමිෂන් සභාවට ප්‍රකාශ ලබා දී ඇති අතර, යුද්ධ හමුදා නිලධාරීන් කටයුතු කළ ආකාරය ඔවුන් විසින් ජනතාවට හා මාධ්‍යවේදීන්ට සිදුකරන ලද අකටයුතුකම් පිළිබඳ ප්‍රකාශ කර ඇත. මේ පිළිබඳව මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවල පුළුල් ලෙස ප්‍රචාරය වූ අතර, මුද්‍රිත මාධ්‍යවල පිටපත් ඉදිරිපත් කර ඇත.

වැලිවේරිය නගරයේ සහ ඒ අවට නිවෙස් වලටද යුද්ධ හමුදා නිලධාරීන් ඇතුලු වී තර්ජනය කරමින් බිය වැද්දවීම් පහරදීම් හා දේපල හානි සිදුකර ඇති බව පැමිණිලිකරුවන්ගේ හා සාක්ෂි කරුවන්ගේ ප්‍රකාශ වල සඳහන් වේ.

2013.08.01 දින වැලිවේරිය හා බැලුම්මහර උද්ඝෝෂණය විසිරුවා හැරීමට ප්‍රධාන වශයෙන් කටයුතු කර ඇත්තේ යුද්ධ හමුදාව බව සමස්ත විමර්ශනයේ දී නිරීක්ෂණය වේ. පොලිස් නිලධාරීන් රජකාරියේ එදින යෙදී සිටිය ද උද්ඝෝෂකයින් විසිරුවා හැරීම යුද්ධ හමුදාවේ කාර්යක් බවට එහිදී පත්වී ඇති බව පෙනීයයි.

යුද්ධ හමුදා නිලධාරීන් මෙම උද්ඝෝෂණය විසිරුවා හැරීමට කැඳවන ලද්දේ කරවුරුන් විසින්ද යන්න පිළිබඳව පැහැදිලි කරමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක මහතා මානව හිමිකම් කොමිෂන් සභාවට වාර්තාවක් ලබාදී ඇත. එකී වාර්තාව අනුව මෙම උද්ඝෝෂණය හේතුවෙන් ගම්පහ කොට්ඨාශ පොලිස් අධිකාරීවරයා අදාළ කාර්මාන්ත ශාලාව ආරක්ෂාව සඳහා පොලිස් විශේෂ කාර්ය බලකාය සහ හමුදා නිලධාරීන් සමඟ එහි රැඳීසිට ඇත. ඒ වන විට ඇතිවූ උග්‍ර තත්ත්වය මැඩ පැවැත්වීම සඳහා එම ස්ථානය අවට ආරක්ෂාව සඳහා යෙදවීමටත් බැලුම්මහර සහ වැලිවේරිය නීති විරෝධී උද්ඝෝෂණ පිළිබඳ කටයුතු කිරීමටත් ඔහුට අවශ්‍ය වූ පොලිස් නිලධාරීන් හා විශේෂ කාර්ය බලකා නිලධාරීන් යෙදවීමේ ඌණතාවයක් මතුවී ඇත. ඒ අනුව අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 95 වන වගන්තියේ 3 වන උප වගන්තිය ප්‍රකාරව පොලිස් අධිකාරීවරයා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව ඒ අවස්ථාව වන විට කර්මාන්ත ශාලාව තුළ හා අවට සිටි හමුදා නිලධාරීන් කණ්ඩායමට විශේෂයෙන් වැලිවේරිය නගරයේ පැවැත්වෙමින් තිබූ තත්ත්වය මැඩ පැවැත්වීම සඳහා ක්‍රියාත්මක වන ලෙසට නියෝග ලබාදී ඇති බව ප්‍රකාශ කර ඇත.

හමුදා ප්‍රධානී බ්‍රිගේඩියර් දේශප්‍රිය ගුණවර්ධන ප්‍රකාශ කර ඇත්තේ 2013.08.01 දින ආරක්ෂක ලේකම් තුමා සමඟ උද්ඝෝෂකයන්ගේ නියෝජිතයන් හා ප්‍රදේශයේ ප්‍රභූන් අතර පල ගැටලුව සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවේ ප්‍රතිඵලය උද්ඝෝෂකයන්ට දැනුම් දීම සඳහා එම ස්ථානයට ගිය බවයි.

ගම්පහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විපිත කොමසාරු මහතා විසින් කොමිෂන් සභාව වෙත ලබා දෙන ප්‍රකාශයේ සඳහන්ව ඇත්තේ උද්ඝෝෂණය විසිරුවා හැරීමට යුද්ධ හමුදාව කවුරුන් විසින් කැඳවුයේද යන්න තමා නොදන්නා බවයි. ලුතිනන් කර්නල් සෝලංගආරච්චි මහතාගේ ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ වැලිවේරිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් දුරකථනයෙන් කරන ලද ඉල්ලීම පරිදි පොලිස් ස්ථානයේ

ආරක්ෂාවට යුද හමුදාවේ සහය ලබා දීමට එහි ගිය බවයි. මෙම ප්‍රකාශවල බැලුබැල්මට එකිනෙකට පරස්පරතාවයන් පෙන්නුම් කරයි. ඒ අනුව පොලිසිය හා යුද්ධ හමුදාව ඔවුන්ගේ වගකීම් අනෙකාට පැවරීමට උත්සාහ කර ඇති බව පෙනී යයි.

බ්‍රිගේඩියර් දේශප්‍රිය ගුණවර්ධන මහතා ලබා දී ඇති ප්‍රකාශය අනුව අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 95 වගන්තිය යටතේ ඇති ප්‍රතිපාදන හා 1947 අංක 25 දරණ මහජන ආරක්ෂක පනතේ 12 : 1 වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිවරයා විසින් නිකුත් කර ඇති 2013.07.03 දිනැති අංක 1817/31 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුවද ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයට අදාළ වන පරිදි යුද හමුදාව කැඳවීමට නෛතික ප්‍රතිපාදන ඇති බවට සඳහන් කර ඇත.

උද්ඝෝෂකයින් විසිරුවා හැරීම සඳහා කිසිදු අවස්ථාවක වෙඩි තැබීමේ නියෝගයක් තමා නොකල බවද බ්‍රිගේඩියර් දේශප්‍රිය ගුණවර්ධන මහතා ප්‍රකාශ කර ඇත. එහෙත් සෙබලුන් විසින් ජිවිත හා දේපල ආරක්ෂාවේ අයිතිය පතා අහසට වෙඩි තබා ඇති බව ඔහු ප්‍රකාශ කර ඇත. පුද්ගලයින් තුන්දෙනෙකු වෙඩි ප්‍රහාරවලින් මියයාම සම්බන්ධයෙන් හා විශාල පිරිසක් තුවාලබා සිටීම සම්බන්ධයෙන් පැහැදිලි පිළිතුරක් ලබාදීමට බ්‍රිගේඩියර් දේශප්‍රිය ගුණවර්ධන මහතා අපොහොසත් වී ඇත.

වැලිවේරිය නගරයේ පැවති උද්ඝෝෂණය විසුරුවා හැරීමට පෙර බැලුම්මහර මංසන්දියේ පැවති උද්ඝෝෂණයේ යෙදී සිටි පිරිස බිය ගන්වා පහරදීම් සිදුකොට පළවා හැරීමෙන් පසු එම යුද්ධ හමුදා භට පිරිස හා නිලධාරීන් වැලිවේරිය නගරයේ පැවති උද්ඝෝෂණය විසුරුවා හැරීමට පැමිණි බව පැමිණිලිකරුවන් ප්‍රකාශ කර ඇති අතර, වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශවලින් ද ඒ බව සනාථ වේ. මුද්‍රිත මාධ්‍යවල පළවී ඇති ඡායාරූප හා මාධ්‍යවේදීන් ඉදිරිපත් කරන ලද ඡායාරූප අනුව යුධහමුදා නිලධාරීන් ගස්වලින් කඩාගත් පොලු අතතිව සිටින බවත් එම පොලුවලින් පුද්ගලයින්ට පහර දෙන ඡායාරූප ද දිස්වන බවත් පෙන්වා දිය හැකිය. ඒ අනුව මෙම යුද්ධ හමුදා නිලධාරීන් ආවේග ශීලීව කටයුතු කරමින් බැලුම්මහර සිට වැලිවේරිය නගරයට අවතීර්ණ වී ඇති බව නිරීක්ෂණය වේ.

2013.08.01 දින බැලුම්මහර හා වැලිවේරිය උද්ඝෝෂණය විසිරුවා හැරීමේ දී පොලිස් නිලධාරීන් විසින් පහරදීම් හෝ වෙඩි තැබීම් සිදුකර ඇති බවට සාක්ෂි හෝ ප්‍රකාශ ලැබී නොමැත.

උද්ඝෝෂකයින් දෙසින් වෙඩි හඬ ඇසුනු බව වගඋත්තරකාර පොලිස් නිලධාරීන් සහ හමුදා නිලධාරීන්ගේ ප්‍රකාශ වල සඳහන් වුවද එවැන්නක් පිළිගත හැකි කිසිදු සාක්ෂියක් අප විමර්ශන කණ්ඩායමට හමුවී නොමැත. ඒ අනුව එම ප්‍රකාශ සත්‍යතාවයෙන් තොර ප්‍රකාශ ලෙස බැහැර කිරීමට සිදුවී ඇත.

උද්ඝෝෂකයන් විසින් ගල්මුල් වලින් වැලිබෝතල් වලින් පෙට්‍රල් බෝම්බ වලින් පොලිසියට හා හමුදාවට පහර දුන් බව පොලිසිය හා හමුදාවේ නිලධාරීන් විසින් ලබාදී ඇති ප්‍රකාශවල සඳහන් වේ.

එක් පොලිස් නිලධාරියෙකු හා හමුදා සෙබලුන් 05 දෙනෙකු තුවාල ලබා ඇති බව වාර්තා වී ඇති අතර, හමුදා සෙබලුන් දෙදෙනෙකුගේ වෛද්‍ය වාර්තා ලැබී ඇත. ගල්වලින් පහරදීම නිසා ඔවුන්ට සුළු තුවාල ඇතිවී තිබු බව එම වෛද්‍ය වාර්තා අනුව පැහැදිලි වේ. ඔවුන්ගේ බරපතල තුවාල කිසිවක් වාර්තා වී නොමැත.

## නිගමන :-

2013.08.01 දින බ්‍රිගේඩියර් දේශප්‍රිය ගුණවර්ධන විසින් මෙගාෆෝනයක් ආධාරයෙන් උද්ඝෝෂකයින් අමතා විසිර යන ලෙස දැනුම් දෙනවිට දෙපිරිස  අතර, වචන හුවමාරුවීමෙන් අනතුරුව උණුසුම් තත්ත්වයක් ඇතිවී උද්ඝෝෂකයින් විසින් හූ කියා ගල්මුල් වලින් පහර දෙනවිට හමුදාව වෙඩි තැබීම් කර ඇති බව පාර්ශවයන් ලබාදි ඇති ප්‍රකාශ අනුව නිරීක්ෂණය වේ. නිලධාරීන්ගේ ආත්ම ආරක්ෂාවට සහ රජයේ දේපල ආරක්ෂාවට ද සෙබලුන්ගේ ගිනි අවි උදුරා ගනිවි යන බියට ද අහසට වෙඩි තැබූ බව සෙබලුන් ප්‍රකාශ කළද අහසට වෙඩි තැබිම පමණක් නොව උද්ඝෝෂකයින් දෙසට වෙඩිතබා ඇති බව තුවාල වී ඇති සහ මියගිය අයගේ අධිකරණ වෛද්‍ය වාර්තා සහ පස්චාත් මරණ පරීක්ෂණ වාර්තා හා අනෙකුත් සාක්ෂි සලකා බැලීමෙන් අනතුරුව නිගමනය කරමු.

උද්ඝෝෂකයින් විසිරුවා හැරීම සඳහා කඳුලු ගෑස් සහ ජල ප්‍රහාර ලබාදීම කැරලි මර්ධන කණ්ඩායම් වල සහාය ලබා ගැනීම සිදු කර ඇත්තේ හමුදාව විසින් වෙඩි තැබීම් ආරම්භ කිරීමෙන් පසුව බව ඉදිරිපත්වී ඇති සාක්ෂි අනුව සනාථ වෙයි.

2013.08.01 දින  වැලිවේරිය නගරයේ උද්ඝෝෂණයේ යෙදී සිටි පිරිසට තුවාල සිදුවූයේ  එහි සිටි යුද්ධ හමුදා නිලධාරීන්ගේ සහ සෙබලුන්ගේ වෙඩි තැබීම් හා පහරදීම්  නිසා බව ඉහත සියලුම පාර්ශවයන්ගේ සාක්ෂි සහ මාධ්‍යවේදීන් ඉදිරිපත් කරණ ලද ඡායාරූප මුද්‍රිත මාධ්‍ය වල ඉදිරිපත් කර තිබූ ඡායාරූප අධිකරණ වෛද්‍ය වාර්තා යන සියල්ල සලකා බැලීමෙන් පසු නිගමනය කරමු.

2013.08.01 දින  වැලිවේරිය නගරයේ උද්ඝෝෂණයේ යෙදී සිටි පිරිස අතරින් මියගිය 03 දෙනෙකුගෙන් දෙදෙනෙකු වෙඩි ප්‍රහාරවලින් මියගියේ එහි සිටි යුද්ධ හමුදාව විසින් වෙඩි තැබීම නිසා බව ඉහත සියලුම පාර්ශවයන්ගේ සාක්ෂි සහ පස්චාත් මරණ පරීක්ෂණ වාර්තා සලකා බැලීමෙන් පසු පැහැදිලි වෙයි.

හමුදාව සහ පොලිසිය ලබාදෙන ලද ප්‍රකාශ අනුව උද්ඝෝෂක පිරිස දෙසින් වෙඩි හඬ ඇසුනු බව ප්‍රකාශ වුව ද කිසිදු ගිනි අවියක් උද්ඝෝෂකයින් ගෙන් සොයාගෙන නොමැති බැවින් හා හමුදා බුද්ධි නිලධාරීන්ගේ ප්‍රකාශ අනුව උද්ඝෝෂකයින් අත ගිනි අවි තිබෙනු නොදුටුව බවට කර ඇති ප්‍රකාශ අනුව උද්ඝෝෂකයින් මෙහිදී ගිනි අවි භාවිතා කර  නොමැති  බව කොමිෂම නිගමනය  කරයි.

පාර්ශවයන් ගෙන් ලබාදෙන ලද ප්‍රකාශ පුවත් පත් වාර්තා සහ ඡායාරූප නිරීක්ෂණය කිරීමෙන් පසු වැලිවේරිය කතෝලික දේවස්ථාන තුළට ආරක්ෂාව සඳහා දිවගිය පිරිසට හමුදාව විසින් පහරදී ඇති බවද පැහැදිලි වේ.

පොලිස් නිලධාරීන් විසින් පහරදීම් සිදුකල බවට පැමිණිලි හෝ සාක්ෂි ඉදිරිපත් වී නොමැති බැවින් පොලිස් නිලධාරීන් විසින් පහරදීම් සිදුකර නොමැති බවට නිගමනය කරමු.

උද්ඝෝෂණය මැඩ පැවැත්වීම සඳහා පොලිසිය වෙත පුහුණුව ලත් නිලධාරීන් උපකරණ සහ නෛතික බලය යන සියලු පහසුකම් තිබිය දී  මෙම උද්ඝෝෂණය මැඩ පැවැත්වීමට යුද්ධ හමුදාවට භාරදී ඉවත් වීම තුළ පොලිස් නිලධාරීන් තම රාජකාරි යම්තාක් දුරට මගහැර ඇති බවට පෙනී යයි.

මෙම උද්ඝෝෂණයට හේතුවු ප්‍රධාන කාරණය බීමට පිරිසිදු ජලය ලබාගැනීමට අවශ්‍ය පියවර ගැනීමට රජයට බලකර සිටීම සඳහා වු සංවේදි කාරණයක් බැවින් යුද්ධ හමුදාව ආවේගශීලිව කටයුතු නොකර ක්‍රියා කළ යුතුව තිබිනි.

මෙම සිද්ධියේදි උද්ඝෝෂණය මැඩ පැවැත්වීම සඳහා යුද්ධ හමුදාව එම ස්ථානයට කැඳවීම් කරන ලද්දේ කවුරුන් විසින්ද යන්න පිළිබඳ නිශ්චිතව හදුනාගෙන නැත. ඒ පිළිබඳව අදාළ පාර්ශවයන් පරස්පර විරෝධිව කරුණු ඉදිරිපත් කර ඇත. එමෙන්ම මෙම උද්ඝෝෂණය විසුරුවා හැරීමේදි වෙඩි තැබීම් හා පහරදීම් සිදුකර ඇත්තේ යුද්ධ හමුදාව විසින් බව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කරන ලද විමර්ශනයේදි හෙලිවී ඇත.

සාධාරණ ඉල්ලීම් දිනාගැනීම සඳහා සාමකාමී උද්ඝෝෂණ හා විරෝධතා පැවැත්වීම ජනතාවගේ මූලික අයිතිවාසිකමක් වන අතර, මහජනතාවට ඒ සඳහා ඉඩ ප්‍රස්ථාව තිබිය යුතුය. ජනතාව විසින් මහජන දේපල විනාශ කරමින් තවත් පාර්ශවයන්ට හානි වන ආකාරයෙන් කටයුතු කරන්නේ නම් ඒවා වැලැක්වීමට පියවර ගැනීමට වගඋත්තරකරුවන්ට හැකියාව ඇත. එහෙත් මෙම සිද්ධියේදි යුද්ධ හමුදාව බලය ඉක්මවා කටයුතු කර ඇති බව පෙනී යන අතර, මෙම උද්ඝෝෂණයේ යෙදි සිටි පිරිසට වෙඩි තැබීම් හා පහරදීම් සිදු කිරීම හේතු කොට ගෙන පුද්ගලයන් තුන් දෙනෙක් මිය ගොස් විශාල පිරිසකට බරපතල තුවාල සිදු කොට ඇත.

යුද්ධ හමුදා සෙබලුන් ආත්මාරක්ෂාව හා දේපල ආරක්ෂාව උදෙසා ගිනි අවි භාවිතා කළ බව ප්‍රකාශ කළද සිදුවීම සිදුවු අවස්ථාවේදි පුද්ගලයන් හට පහරදීමේ ස්වභාවය, රැකවරණ ස්ථානවල සිටියදි පවා සොයා ගොස් පහරදීම, ඔවුන්ට සිදුවී ඇති බරපතල ශාරීරික තුවාල ආදි කරුණු දෙස බලන විට උද්ඝෝෂණයේ යෙදි සිටි පිරිස දේවස්ථානයට දිවගිය විට එහිදි පහරදීම් සිදුකිරීම, වැලිවේරිය නගරයේ පිහිටි ටෙලිකොම් ආයතනය වැනි ආයතන වලට ඇතුලුවී එහි සිටින සේවකයින්ට පහරදීම, අවට නිවාසවලට ඇතුලුවී පුද්ගලයන්ට පහරදීම් හා දේපල හානිකිරීම් සිදුකිරීම, උද්ඝෝෂණයේ යෙදි සිටි පුද්ගලයින්ට වෙඩිතබා තුවාල සිදුකිරීම එම වෙඩි තැබීම් හේතුකොටගෙන පුද්ගලයින් 03 දෙනෙකු මියයාම යන කරුනු සලකා බැලීමේදි යුද්ධ හමුදාව බලය අයුතු ලෙස යොදවා ඇති බවට සහ බලය ඉක්මවා කටයුතු කර ඇති බවට නිගමනය කරමු.

මෙම සිද්ධිය සිදුවු ස්ථානයේ යුද්ධ හමුදාවේ ඉහළ නිලධාරීන් සිටියද කිසිදු ඉහළ නිලධාරියෙකුගේ නියෝගයක් නොමැතිව යුද්ධ හමුදා සෙබලුන් විසින් උද්ඝෝෂණයේ යෙදි සිටි පිරිසට වෙඩි තැබීම් හා පහරදීම් සිදුකර ඇති බැවින් එය බරපතල තත්ත්වයක් මෙන්ම හා යුද්ධ හමුදා විනය සම්බන්ධ ගැටළුද මතු කරයි. එවැනි තත්ත්වයක් නිරෝගි ප්‍රජාතන්ත්‍රවාදි සමාජ පාලනයකටද අනතුරුදායක තත්ත්වයන් වර්ධනය විමට ඇති ඉඩකඩ පිළිබඳවද කොමිෂන් සභාවේ අවධානය යොමු වේ.

## නිර්දේශ :-

කොමිෂන් සභාව අදාළ සියලු කරුණු සැලකිල්ලට ගෙන පහත සඳහන් නිර්දේශ කර සිටී.

01. 2013.08.01 දින වැලිවේරිය සහ බැලුම්මහර උද්ඝෝෂණ විසුරුවා හැරීමට සහභාගි වූ යුද හමුදා අණදෙන නිලධාරීන් හා ප්‍රධාන නිලධාරීන්ට එරෙහිව යුද හමුදා විනය අනුව කටයුතු කළ යුතුය.

02. හමුදා අණකින් තොරවම වෙඩි තබා ඇති නිලධාරීන්ට එරෙහිව උපරිම ලෙස හමුදා විනය අනුව හා සාමාන්‍ය අපරාධ නීතිය යටතේද පියවර ගත යුතුය.

### මීට අමතරව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

- වෙඩි වැදී මියගිය පුද්ගලයින්ගේ ලගම ඥාතීන්ට වන්දි ලබාදීම.
- වෙඩි වැදීමෙන් හා පහරදීම් වලින් තුවාල ලබා ඇති අයට සාධාරණ වන්දි මුදලක් ගෙවීමට කටයුතු කිරීම.
- මාධ්‍යවේදීන්ට පහරදීම ඔවුන්ගේ උපකරණ වලට අලාභහානි කිරීම සම්බන්ධයෙන් සුදුසු වන්දි මුදල් ගෙවීමට රජය පියවර ගත යුතුය.
- ප්‍රථමයෙන් උද්ඝෝෂණයේ යෙදී සිටි පිරිස විසුරුවා හැරීමට සහභාගි වු නිලධාරීන්ටද අනතුරුව සියලුම යුද්ධ හමුදා නිලධාරීන් ද ආවරණය වන පරිදි මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩ පිළිවෙලක් යුද්ධ හමුදාපතිවරයා විසින් සකස් කිරීම හා ඒ සඳහා කොමිෂන් සභාවේ සහය ලබා ගැනීම.
- මෙවැනි අවස්ථාවලදී පොලිසියේ වගකීම හා කාර්ය භාරය පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතුය.
- මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව පිළිබඳව පොලිසියේ හා හමුදාවේ වගකීමක් ඇති බැවින් ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය උපදෙස් ලබාදෙන ලෙසට පොලිස්පතිවරයාට සහ හමුදාපතිවරයාට දන්වා සිටිය යුතුය.
- ඉදිරියේදී උද්ඝෝෂණ විසිරුවා හැරීමේදී ප්‍රථමයෙන් පොලිසිය ඊට අවශ්‍ය පියවර ගතයුතු බවටත් පොලිසියට කටයුතු කළ නොහැකි අවස්ථාවකදී පමණක් විධිමත් කාර්ය පටිපාටිය අනුගමනය කරමින් හමුදාවේ සහය ලබා ගැනීමටත් මෙවැනි අවස්ථාවලදී ජනතාව සමඟ සම්බන්ධීකරණ කටයුතු තවදුරටත් පොලිසිය විසින් සිදුකල යුතුය.

හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ප්‍රියන්ත ආර්.පී.පෙරේරා ..................................................
සභාපති,
මානව හිමිකම් කොමිෂන් සභාව.

ටී.ඊ.ආනන්ද රාජා, ..................................................
කොමසාරිස්

ජසීමා ස්මයිල් ..................................................
කොමසාරිස්

ආචාර්ය එස්.ඩබ්.ප්‍රතිභා මහානාමහේවා ..................................................
කොමසාරිස්

වෛද්‍ය බර්නාඩ් ද සොයිසා ..................................................
කොමසාරිස්

පිටපත් : 01. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය, කොළඹ 01

02. ලේකම්, ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය,කොළඹ 03

03. ලේකම්, අධිකරණ අමාත්‍යාංශය, අලුත් කඩේ, කොළඹ 12.

04. ලේකම්, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය, 13 වන මහල, II වන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල.

05. නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව, කොළඹ 12.

06. හමුදාපති, යුද්ධ හමුදා මූලස්ථානය, කොළඹ 01.

07. පොලිස්පති, පොලිස් මූලස්ථානය, කොළඹ 01.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො : 165, කිංසි පාර, කොළඹ - 08. ශ්‍රී ලංකාව
දුරකථන : + 94 11 2694625, 11 2685980, 112685981
ෆැක්ස් : + 94 11 2694624
විද්‍යුත් තැපැල් : sechrc@sltnet.lk වෙබ් : www.hrcsl.lk
ක්ෂණික : 1996